# උහන ප්‍රාදේශීය සභාවේ පැවති 07 වන සභා වාරයේ පනස් හයවන සභා රැස්වීම් වාර්තාව

දිනය :- 2022.11.17 පෙ.ව. 9.30

1. ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මයා ගරු සභාපති
2. එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මයා ගරු උප සභාපති
3. රංජිත් වනිගසිංහ ඒකනායක මයා ගරු ප්‍රා.ස. මන්ත්‍රී
4. ඒ සුසන්ත කුමාර කුසුම්සිරි මය ගරු ප්‍රා.ස. මන්ත්‍රී
5. ඩී. ආරියරත්න දෙලංකාවල මයා ගරු ප්‍රා.ස. මන්ත්‍රී
6. ඊ.ආර්. සුමනාවති මිය ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී
7. පූජ්‍ය උඩවෙල ධම්මතිලක හිමි ගරු ප්‍රා.ස. මන්ත්‍රී
8. එල්.එච්. කරුණාසේන දයාතිලක මයා ගරු ප්‍රා.ස. මන්ත්‍රී
9. පී.ඒ.අයි. සන්ධ්‍යා පලිහක්කාර මිය ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී
10. එන්.ජී. චතුරංග දර්ශන කුමාර මයා ගරු ප්‍රා.ස. මන්ත්‍රී
11. එම්.එම්. මාලක මිහිර බණ්ඩාර මයා ගරු ප්‍රා.ස. මන්ත්‍රී
12. එන්.එච්. ලාල් ජයන්තසිරි මයා ගරු ප්‍රා.ස. මන්ත්‍රී
13. එල්.ආර්. චන්ද්‍රසේකර බණ්ඩාර මයා ගරු ප්‍රා.ස. මන්ත්‍රී
14. එච්.පී. ජයතිලක මයා ගරු ප්‍රා.ස. මන්ත්‍රී
15. ආර්.ඒ.ඩී. සිසිර ශාන්ත කුමාර මයා ගරු ප්‍රා.ස. මන්ත්‍රී
16. කේ.වී.ජී. නයනා කුමුදුනි මිය ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී
17. කේ.එච්. චමින්ද පුෂ්ප කුමාර මයා ගරු ප්‍රා.ස. මන්ත්‍රී
18. එන්. අමරකීර්ති මයා ගරු ප්‍රා.ස. මන්ත්‍රී
19. ඒ. නන්දිකා ප්‍රියන්ති කුමාරි මිය ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී
20. ජේ.පී. සුගන්ධි ෂාවිකා මිය ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී
21. ඩබ්. රාණි මැණිකේ මිය ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී
22. ජේ.ආර්. ජගත් ප්‍රසන්න මයා ගරු ප්‍රා.ස. මන්ත්‍රී
23. කේ.බී. විමලරත්න මයා ගරු ප්‍රා.ස. මන්ත්‍රී
24. ආර්.එම්. ජයවීර රත්නායක මයා ගරු ප්‍රා.ස. මන්ත්‍රී
25. එච්.පී. ප්‍රියන්ත සිසිර කුමාර මයා ගරු ප්‍රා.ස. මන්ත්‍රී
26. ඩබ්.ඩී. දර්ශන නුවන් විශ්නදේව මයා ගරු ප්‍රා.ස. මන්ත්‍රී
27. ඩී.එම්. සීතා කුමාරිහාමි මිය ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී

නොපැමිණි ගරු මන්ත්‍රීවරුන්

1. පී.කේ. තරිඳු තුෂාන් ධනංජය මයා ගරු ප්‍රා.ස. මන්ත්‍රී
2. කේ.එම්. කුලතුංග මයා ගරු ප්‍රා.ස. මන්ත්‍රී
3. ඒ.ලලිත් කුමාර මයා ගරු ප්‍රා.ස. මන්ත්‍රී
4. කේ. ප්‍රේමසිරි මයා ගරු ප්‍රා.ස. මන්ත්‍රී

01.ආගම සිහිකිරීම හා මියගිය රණ විරුවන් සිහිකිරීම

ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි සියළුම මන්ත්‍රීවරු පිළිගැනීමෙන්ද ආගමික වතාවත් සිදු කිරීමෙන් අනතුරුව රට වෙනුවෙන් දිවිපිදූ රණවිරුවන් සිහි කිරීමෙන් පසු පෙ.ව. 9.30 රැස්වීම් කටයුතු ආරම්භ කරන ලදී.

රැස්වීම ආරම්භයේදී ගරු මන්ත්‍රීවරුන් 15 දෙනෙක් පැමිණ සිටින ලදී.

| | | |
|---|---|---|
| 1. | ටී.ජී. උපුල් ප්‍රියන්ත විජේවර්ධන මයා | ගරු සභාපති |
| 2. | රංජිත් වනිගසිංහ ඒකනායක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 3. | ඩී. ආරියරත්න දෙලංකාවල මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 4. | එල්.එච්. කරුණාසේන දයාතිලක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 5. | පී.ඒ.අයි. සන්ධ්‍යා පලිහක්කාර මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 6. | එන්.ජී. චතුරංග දර්ශන කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 7. | එම්.එම්. මාලක මිහිර බණ්ඩාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 8. | එන්.එච්. ලාල් ජයන්තසිරි මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 9. | එල්.ආර්. චන්ද්‍රසේකර බණ්ඩාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 10. | එච්.පී. ජයතිලක මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 11. | ආර්.ඒ.ඩී. සිසිර ශාන්ත කුමාර මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |
| 12. | කේ.වී.ජී. නයනා කුමුදුනි මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 13. | ඒ. නන්දිකා ප්‍රියන්ති කුමාරි මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 14. | ඩබ්. රාණි මැණිකේ මිය | ගරු ප්‍රා.ස. මන්ත්‍රිනී |
| 15. | කේ.බී. විමලරත්න මයා | ගරු ප්‍රා.ස. මන්ත්‍රී |

**02.පසු ගිය මස සභා වාර්තාව ඉදිරිපත් කිරීම.**

**ගරු සභාපතිතුමා**

මා විසින් න්‍යාය පත්‍රය සමග ලැබෙන්නට සැලැස්වූ පසුගිය මස සභා වාර්තාව කියවන ලද සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් නොමැති නම් වාර්තාගත කර ඇති පරිදි ස්ථිර කර ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු සභාපතිතුමා**

උඩහ ප්‍රාදේශිය සභාවේ මන්ත්‍රීවරයෙකු වන කේ.බී. විමලරත්න මන්ත්‍රීතුමාගේ මැණියන් පෙරේදා දිනයේ අභාවප්‍රාප්ත වී ඇති බවත්, මම එය දැන ගත්තේ ඊයේ බවත්, සභාවේ මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකුට මම එය දැනුවත් තළ බවත් , සමහර මන්ත්‍රීවරු එම පණිවිඩය නොදන්නා නිසා මලගෙදරට සහභාගී වීමට බැරි වීමට සිදුවන්නට ඇති බවත්, සභාපතිතුමා , උප සභාපතිතුමා ප්‍රමුඛ සියළුම මන්ත්‍රිමණ්ඩලයේ හා ලේකම්තුමිය ප්‍රමුඛ සමස්ත කාර්ය මණ්ඩලයේ ශෝකය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.බී.විමලරත්න මයා.**

වාර්තාවේ අඩුපාඩු ඉදිරිපත් කිරීමට ප්‍රථමයෙන් මාගේ මෑණියන් පෙරේදා අභාවප්‍රාප්ත වූ බවත්, එම අවස්ථාවට යම් පිරිසක් සම්බන්ධ වූ බවත් , සමහර අයට ඒ සඳහා සම්බන්ධ වෙන්නට බැරිවී තිබෙන බවත්, මවගේ අභාවය පිළිබඳ පණිවිඩය මන්ත්‍රීවරුන්ට ලැබී නොතිබුන බවත් , මටත් ඒ පිළිබඳව දැනුම් දීමට නොහැකි වූ බවපෙන්වා දෙන ලදි.ඒ කෙසේ වෙතත් මවගේ අභාවය පෙරේදා දිනයේ සිදුවූ බවත් , අපි සියළුදෙනා සාකච්ඡාකර ඉක්මනින් අවසන් කටයුතු කිරීම සුදුසු බව තීරණය කර ඊයේ දිනයේ එම අවසන් කටයුතු සිදුකල බවත් , අම්පාර ආදාහනාගාරයට ගෙන යාමට තීරණය කර අම්පාර නගර සභාවෙන් විමසූ විට ආදාහනාගාරයට අකුණක් ගැසීම හේතුවෙන් එය කැඩී ඇති බව දන්වා සිටි බවත්. ඒ අවස්ථාවේ සෑහෙන අපහසුතාවයකට පත්වූ බවත් ඒ පිළිබඳව අම්පාර නගර සභාව ගැන කණගාටු වන බවත් ප්‍රකාශ කරන ලදි. සභාවේ යම් පිරිසක් මෙම අවස්ථාවට සම්බන්ධ වූ බවත්, ඔවුන්ට ස්තුතිය පුද කරන බවත් , එම අවස්ථාවට සම්බන්ධ වීමට බැරි වූ අය ගැන ප්‍රශ්නයක් නැති බවත් , මා ඒ ගැන නොසිතන බවත්, මේ දිනවල තිබෙන තත්වය මත කුඹුරුවල වැඩ නිසා ඒවා කරන්නට ඕන බවත් ,මා ඒ පිළිබඳ ගනන් නොගන්නා බවත් ප්‍රකාශ කරන ලදි.සියළු දෙනාටම මාගේ ගෞරවය , ස්තුතිය , ප්‍රණාමය පුද කරන බව ප්‍රකාශ කරන ලදි.එසේම වාර්තාවේ යම් අඩුපාඩු ටිකක් තිබෙන බවත් , මාගේ කතාවේ එක් තැනක දීර්ඝ කියන එක දීගර් ලෙස සඳහන් වී ඇති බවත් , තව තැනක කාර්ය කියන එක කායර් ලෙස සඳහන් වී ඇති බවත් , දෙමළ වචන වාගේ කියවන්නට සිදුවී ඇති බව ප්‍රකාශ කරන ලදි. රුපියල් ලක්ෂ අටක් A4 කොල සඳහා වියදම් කිරීම සම්බන්ධව මම කියපු කතාවේ අසූ දහස ලෙස සඳහන් වී ඇති බවත් එය නිවැරදි විය යුතු බව ප්‍රකාශ කරන ලදි.කිහිප තැනකම වාර්තාව කියන වචනයට වාතර්යාව ලෙස සඳහන් වී ඇති බවත් , ඒවා නිවැරදි විය යුතු බව ප්‍රකාශ කරන ලදි.අන්තර්ගතය කියන වචනයට අන්තගර්තය ලෙස සඳහන් වී ඇති බවත් එම වචන නිවැරදි කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

**සංශෝධන 01**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. බී. විමලරත්න මහතා**

ගරු සභාපතිතුමනි, 2023 වර්ෂයේ අයවැය කෙටුම්පත සභාවට ඉදිරිපත් කර ඇති බවත්, මයික්‍රෆෝන් ඇහෙන්නෙත් නැති නිසා සභාපතිතුමා පැවසූ කිසිම දෙයත් ඇහුනේ නැති බවත් කෙසේ නමුත් අයවැය කෙටුම්පත සම්බන්ධව දීර්ඝ ලෙස කතා කිරීමට බලාපොරොත්තු නොවන බවත් පෙන්වා දෙන ලදී. මම යෝජනා දමන්නේ නැති බවත් හේතුව මම තරම් මේ සභාවට යෝජනා ගෙන ආ කෙනෙකු නැති බවත් , ප්‍රශ්න අහපු කෙනෙක් නැති බවත් ප්‍රකාශ කරන ලදී. සියලුම දෙනා එය පිළිගන්නා බවත් ගිය සභාවට පෙර සභාවේ උප සභාපතිතුමා එය පිළිගත් බවත් ප්‍රකාශ කරන ලදී. මම සරලම යෝජනාවක් මේ සභාවට ගෙන ආ බවත්, වැලි ට්‍රැක්ටරයක් උවමනා නැති, වැලි කුබෝටාවක් ඕන, වැලි තාච්චි දෙක තුනක් ඕන පුද්ගලයකුට වැලි එකක් ගන්න හාඩ්වෙයාර් වලට වැලි අරගෙන ඒ හරහා පාරිභෝගිකයාට දෙන්න සභාව මැදිහත් වී කරන්න යැයි යෝජනාව ගෙන ආවත් නමුත් එය අද වන තුරු ක්‍රියාත්මක නොවූ බවත්, ඒ සඳහා සත පහක වියදමක් නොයන බවත් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම මේ වර්ෂයේ පෙබරවාරි මාසයේ 18 ජනපදයේ මීටර් 700 ක පාරක් හැදීම සඳහා ගම් දෙකක ජනතාව එහා මෙහා යන පාරක් හදන්න යෝජනා කල බවත් නමුත් අදටත් එම යෝජනාව ක්‍රියාත්මක නැති බවත් පෙන්වා දෙන ලදී. මේ මුලු සභාවෙන්ම එම යොජනාව ක්‍රියාත්මක කරන්නට යැයි සම්මත කල බවත්, මම දන්නා නීති හා රීති අනුව සභාවට යෝජනාවක් කර වැඩි ඡන්දයෙන් සම්මත වුව හොත් එය ක්‍රියාත්මක කල යුතු බවත්, අයවැය ප්‍රතිපාදන ඇති නිසා එම යෝජනාව ක්‍රියාත්මක කල හැකි බවත්, නමුත් මම ඒ ගැන සොයා නොබලන බවත්, මම නැවත යෝජනා ඉදිරිපත් නොකරන බවත්, යෝජනා ඉදිරිපත් කරන එකේ තේරුමක් නැති බවත් ප්‍රකාශ කරන ලදී. තවත් එකක් ලෙස ආදල් ඔය බස් නැවතුම් පොල සම්බන්ධව මම යෝජනාවක් දැමූ බවත්, එය ඉදිරිපත් කළේ ගමෙන් පැමිණි සංදේශයකට අනුව බවත්, නමුත් අදවන තුරු එය ක්‍රියාත්මක නැති බවත්, එය පරීක්ෂා කිරීමට ලේකම්තුමිය හා කාර්ය මණ්ඩලයේ කිහිප දෙනෙකුත් එතනට ගිය බවත්, අපිත් එතනට පැමිණි බවත්, ඒ පිළිබඳව මොනවා වුනාද යන්න නොදන්නා බවත් ප්‍රකාශ කරන ලදී. මා විසින් පොඩි යෝජනාවක් ගෙන එන බවත්, මේ කෙටුම්පත දකින විට

එපාවන බවත්, මෙහි විශාල පොටෝ තොගයක් තිබෙන බවත්, පොදු පරිපාලනය තුල 103/102 A/4 කොළ මිල ඉහලයාම, ලියා පදිංචි ගාස්තු ඉහලයාම හේතුවෙන් රු: 800000.00 ක් ඇස්තමේන්තු කර ඇත. මේ අයවැය කොටුම්පත දුටුවිට මේ ආකාරයේම පොතක් නැවත අපට ලබා දෙන බවත් පෙන්වා දෙන ලදී. වියදම් අඩු කිරීම සදහා මේ පොතම ඊලග සභාවට අපට රැගෙන ඒමට පවසා සිටීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. සංශෝධන මොනවත් නොමැති නම් මේ පොතම නැවත රැගෙන එන ලෙස ප්‍රකාශ කරන ලෙසත් එවිට වියදම් අඩු කරගත හැකි බවත් පෙන්වා දෙන ලදී. ඊලග කාරණය ලෙස මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව ගිය සභා වාරයට ඔබතුමා ඉදිරිපත් කල බවත්, එවිට මෙහි අන්තර්ගතය ඇති බවත්, එම නිසා එහි හැම ඉලක්කයක්ම අයවැය කෙටුම්පතට ඇතුලත් විය යුතු බවත්, එවිට මූල්‍ය ප්‍රතිපත්ති කමිටු වාර්තාව ප්‍රතික්ෂේප වී නොමැති බවත්, මම මේ වාර්තාව මුල සිට කියවාගෙන යන විට මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව සම්බන්ධව කතාකරන ලද යම් කාරනා කීපයක් තිබෙන බවත්, එහිදී රංජිත් මන්ත්‍රිතුමා 1/61 සම්බන්ධව කතාකර ඇති බවත්, පොලී අනුපාතය ඔබතුමා 150000.00 ක් කරන ලෙස සදහන් කරන ලෙසත් නමුත් සභාපතිතුමා එම ගිණුමෙන් මුදල් ලබා නොගත් නිසා 200000.00 ක් දමන ලෙස කතාකර ඇති බවත්, එමෙන්ම මේ මූල්‍ය ප්‍රතිපත්ති කමිටු වාරතාවේ 5/24 පොළ බදු සම්බන්ධව සාකච්ජා කර ඇති බවත්, එය නිවරදි වී නැති බවත්, එහි ලක්ෂ 40 ක ලක්ෂ 25 දක්වා අඩු වී ඇති බවත්, 6/43 රජගල පුරා විද්‍යා භූමියේ මුදල් උත්පාදනය සදහා රු.350000.00 ක් එකතු කර ඇති බවත්, එය රු.500000.00 දක්වා වැඩිකරන ලෙස මෙහි යෝජනාවකින් කියා ඇති බවත්, ඒ ටික පමණක් සංශෝධනය විය යුතු බවත් , වෙන මොනවත් මම මේ වාර්තාවේ නොදැක්ක බවත් , මූල්‍ය ප්‍රතිපත්ති කමිටු වාර්තාව සභාවට ඉදිරිපත් කල පසු කිසිම මන්ත්‍රීවරයකු නැගිට කතා කර නැති බවත් , මේ වාර්තාවේ එසේ කතාකර ඇති බව නොදැක්ක බවත් ප්‍රකාශ කරන ලදී.නමුත් මේ මූල්‍ය ප්‍රතිපත්ති කමිටු වාර්තාව මේ සභාවේදී කතා කල බව මේ වාර්තාවේ එක ඉලක්කමක්වත් අඩුපාඩු නැතිව සදහන් වී ඇති බව ප්‍රකාශ කරන ලදී. එසේ නම් මේ මුදල් ප්‍රතිපත්ති කමිටු වාර්තාව ගිය සභාවේ හිටපු සියළු දෙනාම පිළි අරගෙන ඇති බවත් , රංජිත් මන්ත්‍රීතුමා කරන ලද සංශෝධන වලට යටත්ව එය පිළිඅරගෙන ඇති බවත් ,එසේ නම් මෙහි සදහන් වී ඇති පොදු පරිපාලනය 2023 වර්ෂය සදහා පුනරාවර්තන වියදම් සකස් කිරීම ,මේ පොදු පරිපාලනය මේ පොතේ යම් මුදලක් ඇති බවත් , නමුත් කෙටුම්පතට එනවිට එම මුදල අඩු වී ඇති බවත් ,රු.850000.00 කෙටුම්පතට එනවිට අඩු වී ඇති බවත් , මෙය අඩු වීමට හේතුව මම නොදන්නා බවත් , මා මේ පිළිබදව දැනගන්නට කැමති බව ප්‍රකාශ කරන ලදී.පිටු අංක 33 මෙලෙස සදහන් වී ඇති බවත් , 2023 වර්ෂයේ ආදායම් ඇස්තමේන්තුව යටතේ ස්වයං උත්පාදන ආදායම් මේ කෙටුම්පතට පැමිණිය යුතු බවත් , මේ මුදල් ප්‍රතිපත්ති කමිටුව සකස් කරපු මේ ආදායම, මේ කෙටුම්පතට ඇතුලත් විය යුතු බවත් පෙන්වා දෙන ලදී. පොදු පරිපාලනය තුල මුදල් ප්‍රතිපත්ති කමිටු වාර්තාවේ එක්කෝටි විසිහතර ලක්ෂ හතලිස්හත් දහස් හත්සිය අසූහතරයි ශත පනස්පහයි (12447784.55) මම ගියවර සභාවාරයට නොපැමිණි නිසා වාර්තාව පදනම් කරගෙන කතාකරන බවත් පෙන්වා දෙන ලදී. නමුත් කෙටුම්පතෙහි එක්කෝටි පහලොස් ලක්ෂඅනූහතර දහස් හත්සිය අසූහතරයි ශත අනූ හයයි. (11594784.96) අටලක්ෂ පන්දහසක් අඩුවී ඇති බවත් ආදායමෙන් රු.850000.00 ක් අඩු වූයේ ඇයි දැයි විමසන ලදී.මෙය අඩු කරන්න හේතුව කුමක්දැයි විමසන ලදී.එසේ නම් එය වාර්තාවේ සදහන් විය යුතු බව පෙන්වා දෙන ලදී.සෞඛ්‍ය සේවා ගත්තත් , භෞතික සැලසුම් මංමාවත් ගත්තත් , උපයෝගීතා සේවා ගත්තත් , සියල්ලම වෙනස්වී ඇති බවත් භෞතික සැලසුම්වල රු.150000.00- ක් වැඩි කර දමා ඇති බවත් , සෞඛ්‍ය සේවාවල රු.100000.00 ක් අඩු වී ඇති බවත්, උපයෝගීතා සේවාවල රු.868800.00 ක් අඩු වී ඇති බවත් , සුභසාධන සේවාවල රු.150000.00 ක් වැඩිවී ඇති බවත් , එම රු.150000.00 ක් වැඩිවීම පමණක් මා පිළිගන්නා බවත් ,එය පමණක් වාර්තාවේ සදහන් වී ඇති බවත් , එම රු.150000.00 ක මුදල රජගල පුරාවිද්‍යාභූමියේ රු.350000.00 සිට රු.500000.00 ක් දක්වා වැඩිවීම බව පෙන්වා දෙන ලදී.අනිත් කරුණු වලට අදාල මුදල් අඩුවීමට හේතු විමසන ලදී. පොදු පරිපාලනය , සෞඛ්‍ය සේවා, උපයෝගීතා සේවා කියන ඒවා අඩු වෙන්නත් ,භෞතික සේවා හා සුභසාධන වැඩි වෙන්නත් මෙහි කොහේද සදහන්ව ඇත්තේ යැයි විමසන ලදී.සුභසාධන කටයුතු සදහා පමණක් මේ වාර්තාවේ සදහන් වී ඇති බවත් , මා එය පිළිගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.අනිත් ඒවා එසේ වෙනස් වෙනවා නම් ,කාරක සභා අවස්ථාවකදී හෝ වෙනස් වෙනවා නම් , මේ වාර්තාවට ඒවා ඇතුලත් විය යුතුමයි යැයි ප්‍රකාශ කරන ලදී. එය මාගේ තර්කය බව ප්‍රකාශ කරන ලදී.එම නිසා මේක මේ සභාවේ කතා කර නැති බවත් නමුත් මේ කෙටුම්පතේ මෙසේ අඩු වූයේ ඇයිදැයි විමසන ලදී.මම වැරදි නම් නිවැරදි කරන්න මා එය පිළිගන්නට කැමති බවත් ප්‍රකාශ කරන ලදී.එසේම අයවැය ලේඛණයේ පුනරාවර්තන වැය සාරාංශයත් එහි සියල්ල කියන්නට නොයන බවත් එහි එකක් සදහන් කරන්නම් යැයි ප්‍රකාශ කරන ලදී.සුභසාධක එකේ රු.150000.00ක් වැඩියෙන් සදහන් කර ඇති බවත් , වැය

ඇස්තමේන්තුවේ , එසේ ඒවැනි දෙයක් වාර්තාවේ සඳහන් කර නොමැති බවත්, මූල්‍ය ප්‍රතිපත්ති කමිටු වාර්තාව මහා සභාවට ඉදිරිපත් කර ඇති බවත් , ඒ මහා සභාව මූල්‍ය ප්‍රතිපත්ති කමිටු වාර්තාව පිළිඅරගෙන ඇති බවත් ,නමුත් ඒ පිළිගත්ත එක සාකච්ඡා කර ඇති බවත්, රංජිත් මන්ත්‍රීතුමා සංශෝධන දෙකක් ගෙන ඇති බවත් , එකක් අඩුකිරීමට හා එකක් වැඩි කිරීම සඳහා බවත් ,පෙන්වා දෙන ලදි.කෙසේ නමුත් මූල්‍ය ප්‍රතිපත්ති කමිටු වාර්තාව මහා සභාවට ඉදිරිපත් කර ඇති බවත් , ඒ ඉදිරිපත් කරන ලද වාර්තාව කවුරුවත් ප්‍රතික්ෂේප කර නැති බවත් සංශෝධන දෙකක් ඉදිරිපත් කර ඇති බවත් , මේ වාර්තාව සාක්ෂි බවත් , උසාවියට ගියත් මේ වාර්තාවේ එය සඳහන්ව නැත්නම් එය නොමැති බවත් පෙන්වා දෙන ලදි. මේ වාර්තාව හා මූල්‍ය ප්‍රතිපත්ති කමිටු වාර්තාව පදනම් කරගෙන මා කතා කල බවත් මා හට මෙය ගැටළු සහගත තත්වයක් තිබෙන බවත් , ඒ සඳහා මා හට පිළිතුරු අවශ්‍ය නැති බවත් ප්‍රකාශ කරන ලදි.එම නිසා මෙය ඊලග සභා වාරයේදී හෝ නිවැරදි කරන්නට හැකිනම් අන්න ඒ නිවැරදි කිරීමට යටත්ව එය නිවැරදි කලේ කෙසේද , පොදු පරිපාලයේනම් කුමකින්ද අඩුවූයේ , වරිපනම් වලින් අඩු වූවාද , බලපත්‍ර ගාස්තු වලින් අඩු වූවාද , වරෙන්තු ගාස්තු හා දඩ වලින් අඩු කලාද, වෙනත් ආදායම් වලින් අඩු කලාද , සෞඛ්‍ය සේවා ගත්විට බලපත්‍ර ගාස්තු වලින් අඩු කලාද , සේවා සඳහා ගාස්තු අඩු කලාද , යන්න පැහැදිලි කරන ලෙසත් , මෙහි මේ අඩුවැඩි වීම් මට ප්‍රශ්නයක් බවත් , ප්‍රශ්නයක් වෙන්නට හේතුව නම් එය සංශෝධනය වූවානම් මේ සැප්තැම්බර් වාර්තාවේ එය ලියවී තිබිය යුතු බවත් පෙන්වා පෙන්වා දෙන ලදි.මම කතා කරන්නේ මේ වාර්තාව පදනම් කරගෙන බවත් , සභාවේ කතා කලාද නැද්ද යන්න මම නොදන්නා බවත් , මම එම සභාවාරයට නොපැමිණි නිසා ඒ පිළිබඳ අවබෝධයක් නොමැති බවත් ,ප්‍රකාශ කරන ලදි.එම නිසා මම මේ වාර්තාව මුල සිටම අග දක්වාම කියවූ බවත් ප්‍රකාශ කරන ලදි. ඒම නිසා කරුණාකර වැරැද්දක් වූවානම් අපි එය නිවැරදි කරගමු යැයි ප්‍රකශ කරන ලදි. මූල්‍ය ප්‍රතිපත්ති කමිටුවෙන් මූල්‍ය ප්‍රතිපත්ති කමිටු වාර්තාව සාකච්ඡා කර ගත් තීන්දු කොතනද වෙනස් කලේ , කවුද වෙනස් කලේ , කාටද එසේ වෙනස් කරන්නට බලයක් තිබුනේ කියන එක මට දැනගත යුතු බැවින් ලබන සභාවාරයට එය ප්‍රකාශ කරන ලෙස පැහැදිලි කරන ලදි. මම යෝජනා ඉදිරිපත් නොකරන බවත් , යෝජනා ඉදිරිපත් කලාට වැඩක් නැති බවත්. යෝජනා ඉදිරිපත් කලාට ඒවාට කටයුතු සිදුනොවන නිසා යෝජනා ඉදිරිපත් නොකරන බවත් පෙන්වා දෙන ලදි. ගිය සභාවාරයට පෙර සභාවාරයේ ගරු සභාපතිතුමා මා හට චෝදනාවක් එල්ල කල බවත් , 2020 මන්ත්‍රී ප්‍රතිපාදන වලදී සාහිත්‍ය වැඩසටහනක් සඳහා මා යෝජනාවක් ලබා දුන් බවත් , යෝජනාව හා ඇස්තමේන්තුවකුත් ලබාදුන් බවත් ,නමුත් ඒ කාර්ය කොරෝනා නිසා මදක් පරක්කු වූ බවත්, අද උදයේත් ඒ සම්බන්ධව ලේකම්තුමියට කතා කල බවත් , එහි මුදල රු.30000 ක් ඇති බවත් , එහි දේශකයන් ලෙස හිටපු ප්‍රාදේශිය ලේකම් පියදාස මහත්මා හා හිටපු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සුනිල් ගුණතිලක මහත්මා කැඳවා සාහිත්‍ය විචාරයක් කරන්නට යෝජනා කර තිබූ බවත් ප්‍රකාශ කරන ලදි.ඔවුන් මේ ප්‍රදේශයේ සිටින ලේඛකයන් බවත් , ඔවුන්ව අපි අගය කිරීමක් කර නැති බව පෙන්වා දෙන ලදි.මේ පනත අනුව රු. 30000.00 ට යටත්ව මම යෝජනාව ලබාදුන් බවත් , අද තත්වය අනුව රු. 30000.00 කින් එය කරන්නට නොහැකි බවත් පෙන්වා දෙන ලදි. නමුත් එහි චෝදනාව මා වෙත පැමිනි බවත් , මේ මස - 10 , 11 , 12, දැවැන්ත සාහිත්‍ය උත්සවයක් සමනබැද්ද විහාරස්ථානයේ කරන නිසා එම මුදල් එම උත්සවය සඳහා බැර කරන ලෙස මා විසින් ඉල්ලා සිටින බව ප්‍රකාශ කරන ලදි.

**සංශෝධන 02**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා**

අය වැය සංශෝධන ඇතුලත්කර එවූ පසු කෙටුම්පත සම්මත කරන බවත් , අද දිනයේ ඡන්දය නොවිමසන ලෙසත් ප්‍රකාශ කරන ලදි.කෙටුම්පතට ඡන්දය විමසීමක් නොමැති බවත් , අයවැය හරියාකාරව ඉදිරිපත් කල යුතු බවත් , කෙටුම්පතට ඡන්දය නොවිමසන බවත් ප්‍රකාශ කරන ලදි.ගිය වසරේද ඔය ආකාරයට කල බවත් , මෙවර එය එසේ කරන්නට නොදෙන බවත් ප්‍රකාශ කරන ලදි.කෙටුම්පතට ඡන්දය නොවිමසන බවත් , සංශෝධන සියල්ල ඇතුලත් කර අයවැය ඉදිරිපත් කල පසු ඡන්දය විමසීම සිදුවිය යුතු බවත් , පැහැදිලි කරන ලදි.ගිය වසරේත් ඔය වැරැද්දම වූ බවත් , ගියවර අධිකරණයට ගියා නම් සම්පූර්ණ වැරදි ආකාරයට අයවැය සම්මත කර ඇති බව පෙන්වා දෙන ලදි

අයවැය කෙටුම්පත සඳහා ඡන්දය විමසීමට විරෝධය පා එම අවස්ථාවේ ඔරලෝසු වේලාවෙන් ප.ව. 2.10 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ගරු රංජිත් වනිගසිංහ ඒකනායක මහතා සභාවෙන් පිටවී යන ලදී.

**ගරු සභාපතිතුමා**

ඔය කියන ලද අඩුපාඩු අප විසින්ද දුටුව බවත්, එය පරිගණකයේ නිවැරදිව පෙන්වන බවත් , මුද්‍රණය වී එන විට අකුරු මාරු වී වැරදි ආකාරයට වචන සටහන් වී පිටපත ලැබෙන බවත් ප්‍රකාශ කරන ලදි.කිහිප වරක් මෙය නිවැරදි කර මුද්‍රණය කර ගැනීමට උත්සාහ ගත්තද එය නොහැකි වූ බවත් තාක්ෂණික කවුරුවත් නොසිටිය බවත් , එය නිවැරදි කර ඊලග වාර්තාවට සංශෝධන ලෙස ඉදිරිපත් කරන බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.බී.විමලරත්න මයා.**

අපි සභාව අමතා කතා කරන කතාව මෙවැනි වචන වැරදියට වාර්තාවේ සඳහන් වී අපි වාර්තාව සම්මත කල විට එහි අර්තය වැරදි විය හැකි බව පෙන්වා දෙන ලදි.කතාව සම්පූර්ණයෙන්ම වෙනස් වන නිසා මම මේ දේවල් පෙන්වා දෙන බව ප්‍රකාශ කරන ලදි. එම නිසා මේවා සංශෝධනය කර නැවත ඉදිරිපත් කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු සභාපතිතුමා**

පරිගණකයේ වැරදි කියා හැමදාම කියන්නට බැරි බවත් ,කොහේට හෝ ගොස් මුද්‍රණයේ පිටපතක් හෝ රැගෙන විත් නිවැරදි ආකාරයට සභා වාර්තාව ඉදිරියේදී ලබා දීමට කටයුතු කලයුතු උපදෙස් ලබා දෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.9.40 ගරු ප්‍රා.ස.මන්ත්‍රී ජේ.ආර්. ජගත් ප්‍රසන්න මයා පැමිණෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.9.45 ගරු ප්‍රා.ස.මන්ත්‍රී එච්.පී. ප්‍රියන්ත සිසිර කුමාර මහතා පැමිණෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.9.50 ගරු ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඒ.සුසන්ත කුමාර කුසුම්සිරි මහතා පැමිණෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ජේ.ආර්. ජගත් ප්‍රසන්න මයා.**

මේ සභාවේ ආරම්භයේ සිට මේ දක්වා මේ ප්‍රින්ට් එකේ විතරක් නොව සභාවේ සිටින කිසිම කෙනෙක්ට හෙට සභාව කියා තමන්ගේ රාජකාරිය හරියට කරන්නට ඕන හැඟීම නොමැති බවත් කීපදෙනෙකුට හැඟීමක් ඇති බවත් අනිත් කිසිම කෙනෙකුට එහෙම හැඟීමක් නැති බවත් පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

මට තිබෙන ප්‍රශ්නය නම් මෙහෙම අවස්ථාවකදී ඉලක්කම්වලට දශම හා බින්දු වැඩිවුවහොත් ගණන් වෙනස් වන බවත් පෙන්වා දෙන ලදී. අන්තිම දරුණුම ප්‍රශ්නය එය බවත් ඒවාට වගකියන්නේ කවුරුන්ද යන්න විමසන ලදී. එසේම මට තිබෙන ප්‍රශ්නය එය නොවන බවත් පසුගිය සභාවේදී අයවැය කෙටුම්පතක් ලෙස ගෙන පැමිණ ඔබතුමාලා අයවැය සම්මත කර ගත් බවත් මට එය ප්‍රශ්නයක් නොවන බවත් මම මේ සභාවේදී මේ සඳහා විරෝධය පා නික්ම ගිය බවත් මේ වාර්තාවේ ඒ කිසිදු දෙයක් නැති බවත් පෙන්වා දෙන ලදී. එම විරෝධය පා පිටවී ගිය එක මේ සභා වාර්තාවේ තිබිය යුතු බවත් එය මෙහි නැති බවත් ප්‍රකාශ කරන ලදී. දැඩිව විරෝධය පා ගිය එක මේ වාර්තාවේ තිබිය යුතු බව පෙන්වා දෙන ලදී. මේ අයවැයට විරුද්ධ වූ කෙනෙකු ලෙස එය පැහැදිලිව සටහන් විය යුතු බව ප්‍රකාශ කරන ලදී. එය මේ වාර්තාවට ඇතුලත් නොකිරීම හිතාමතාම කරන ලද වරදක් බව ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපතිතුමා**

ඔබතුමා විරෝධය පා පිටවී ගිය බව සභා වාර්තාවේ 85 වන පිටුවේ සඳහන් වී ඇති බවත් ඔබතුමා ප.ව. 2.10 ට පිටවී ගිය බව වාර්තාවේ සඳහන්වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.9.55 ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.එච්. චමින්ද පුෂ්ප කුමාර මහතා පැමිණෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.00 ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී ජේ.පී. සුගන්ධි ශාවිකා මිය පැමිණෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

මම විරෝධය පා ඒ අවස්ථාවේදීම පිටවී ගිය බවත් එය ඒ ආකාරයෙන්ම සටහන් විය යුතු බවත් තව කතා කිහිපයකට පහළින් මා පිටවී ගිය බව සඳහන් වී ඇති බවත් එසේ නොවී විරෝධය පා එම අවස්ථාවේදීම පිටවී ගිය බව වාර්තාවේ සඳහන් විය යුතු බව ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපතිතුමා**

ඔබතුමා විරෝධය පා එම අවස්ථාවේම පිටවී ගිය බව සංශෝධනය කර ඉදිරිපත් කරන බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.එච්. චමින්ද පුෂ්ප කුමාර මයා.**

සභා වාර්තාව සම්මත කරන්නට බැරිව හැමදාම මේ වගේ නාඩගම් වන බවත් පළමුවන ක්‍රියාමාර්ගය මේ සභා වාර්තාව සම්මත කර ගැනීම බවත් එතන පළමුවන තැනදීම ලේ කුපිත කරගෙන යක්කු වගේ හැසිරිලා තමයි මේ සභාව පටන්ගන්නේ. හැමදාම පවසා සිටින්නේ මේ සභා වාර්තාව නිවැරදිව සභාවට ඉදිරිපත් කිරීම බවයි. නමුත් ඔබතුමාට මේ සභා වාර්තාවේ තොරතුරු ටික නිවැරදිව නිලධාරීන් ලවා සභාවට ඉදිරිපත් කිරීමට තවම බැරි වූ බවත් එමනිසා මේ ගැටුම් සහගත තත්ත්වයන් ඇති වන බවත් මෙච්චර කාලයකට සිදුවූයේ ඔය ක්‍රියාදාමය බවත් ප්‍රකාශ කරන ලදී. ජනතාව වෙනුවෙන් කළ යුතු දේවල් සභාවේදී කතා කළ යුතු බවත් නමුත් හැමදාම මොකක්හරි එක දෙයක් අල්ලාගෙන කාලය කා දමන බවත් ප්‍රකාශ කරන ලදී. මෙපමණ කාලයකට ජනතාව වෙනුවෙන් හරි දෙයක් කළා කියලා අපට සතුටු වන්නට පුළුවන්දැයි විමසන ලදී. ඔබතුමා උත්තරීතර සභාවේ සභාපතිතුමා බවත් ඔබතුමා අපට ඇහුම්කන් දෙන්නේ නැත්නම් කවුද අපට ඇහුම්කන් දෙන්නේ යැයි විමසන ලදී. ඔබතුමා අපට ඇහුම්කන් දිය යුතු බවත් ඔබ මේ ප්‍රදේශයේ පළමුවන පුරවැසියා බවත් පෙන්වා දෙන ලදී. මේ මන්ත්‍රීවරුන්ට සභාවේ කතා කිරීමට අවස්ථාව ලබා දෙන ලෙස ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.බී. විමලරත්න මයා.**

මෙතන රීති ප්‍රශ්නයක් තිබෙන බවත් ඔබතුමා ප්‍රාදේශිය සභා පනතේ 8(2) කියවා බලා ඉදිරි කටයුතු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මයා.**

පළමුවෙන්ම විමලරත්න මන්ත්‍රීතුමාට මාගේ කණගාටුව ප්‍රකාශ කරන බවත් එතුමාගේ මැණියන්ගේ අභාවය පිළිබඳ ශෝකය ප්‍රකාශ කරන බවත් ප්‍රකාශ කරන ලදී. මැණියන්ගේ අවමංගල්‍යයට සහභාගීවීමට නොහැකිවීම සම්බන්ධව කණගාටුව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන ලදී. විමලරත්න මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ ආකාරයට සභා වාර්තාවේ අඩුපාඩු මතක් කරගෙන සිටිය බවත් මුද්‍රණයේ විශාල අඩුපාඩු ප්‍රමාණයක්

තිබෙන බවත් මේ ආකාරයට මේ දේවල් සිදුවුවහොත් මන්ත්‍රීවරුන්ට සභා වාර්තාව කියවීමටත් නොහැකි වුවහොත් ඒ ආකාරයටම සම්මත වූ විට අපි ප්‍රකාශ කරපු දේවල් වල අර්ථය අකුරකින් හෝ වෙනස් විය හැකි දේ ඕනතරම් තිබෙන බැවින් මේ ආකාරයට සම්මත වූ විට එය බරපතල වරදක් බව පෙන්වා දෙන ලදී. ඉස්කෝල පොත ෆොන්ට් එක ඔරිජිනල් එකම තිබිය යුතු බවත් එසේ නොමැතිවුවහොත් වෙනත් පරිගණයකට පෙන් ඩ්‍රයිව් එක යොදා මුද්‍රණය කිරීම් කරනකොට අකුරු වෙනස් වන බවත් එයට සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතු බවත් පෙන්වා දෙන ලදී. අතපසුවීම් කා අතිනුත් වන බවත් බරපතල ආකාරයට අතපසුවීම් නොවිය යුතු බවත් එමනිසා ප්‍රථමයෙන්ම මේ කටයුත්ත නිවැරදි කර ගත යුතු බව පෙන්වා දෙන ලදී. සභා වාර්තාවේ මුද්‍රණයේදී වී ඇති අඩුපාඩු නිවැරදි කරන ලෙස ප්‍රකාශ කරන ලදී. අයවැය වාර්තාව සභා වාර්තාවට සම්බන්ධ හෙයින් එය සම්මත වූ නමුත් එහි අඩුපාඩු ටිකක් කතා කළ යුතු බවත් හිටපු සභාපතිවරුන්ගේ ඡායාරූප බැලූ විට මරණ දැන්වීම් ගැසුවා වාගේ තිබෙන බවත් එය අපහාසයක් බවත් ඡායා රූප ඕනතරම් සොයාගන්නට තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. මීට ඉස්සර අයවැය වාර්තාවල හොඳ ඡායාරූප තිබෙන බවත් රංජිත් හිටපු සභාපතිතුමාගෙන් ඡායා රූප ඉල්ලා ගත හැකි බවත් ඒවාවත් පැහැදිළි ආකාරයට සකස් කරන ලෙස ප්‍රකාශ කරන ලදී. අයවැය වාර්තාවේ හැමදාම බලන්නේ නැතිව අතඅරින දේවල් බලන්නට සිතුන බවත් ලේකම්තුමියගේ පණිවිඩයෙහි ලේකම්තුමිය මෙහිදී “කාර්යාක්ෂමතාව, ඵලදායීතාවයන් වෙනුවෙන් ජයග්‍රහණයන්, සම්මානයන් ලබා ඇති අතර සභාවේ කටයුතු කළ ප්‍රධාන විධායකවරුන් මෙන්ම ප්‍රධාන පරිපාලන නිලධාරීන් කාර්යය මණ්ඩලයේ නිලධාරීන් එම සුවිශේෂී ජයග්‍රහණයන් වෙනුවෙන් කැපවී කටයුතු කර ඇති බව වර්තමානයේ උහන ප්‍රාදේශීය සභාව තුළින් විද්‍යාමාන වන සංවර්ධනය තුළින් මනාවට පැහැදිළි වේ” යනුවෙන් සඳහන්වන බවත් ඉතා ලස්සන වචන අපේ ශබ්ද කෝෂවල තිබෙන බවත් සිංහල භාෂාවේ ලස්සන වචන ඕනතරම් තිබෙන නිසා ඒවා යොදාගෙන ලස්සන වචන ඕනතරම් ලියන්නට හැකි බවත් නමුත් ලිපි ලේඛන වැඩිපුර ලියා අපට සම්මාන ඕනතරම් ගන්නට පුළුවන් බවත් නමුත් පාරට බැහලා ප්‍රදේශයේ පිරිසිදුකම, ජනතාව වෙනුවෙන් මොනවද වෙලා තියෙන්නේ, ප්‍රායෝගිකව මිනිසුන්ට දැනෙන දේවල් කරන්නට ඕන තරම් පළාත් පාලන ආයතන තෝරන වැඩපිළිවෙල පිස්සුවක් බවත් පෙන්වා දෙන ලදී. මිනිසුන්ට දැනෙන්නට උවමනා දේ නොකරන බවත් සෝබන දේවල් සිදුවන බවත් පෙන්වා දෙන ලදී. එමනිසා සභාවෙන් මිනිසුන්ට හැඟෙන දැනෙන දේවල් වලින් සභාවට සම්මාන දිය යුතු බව පෙන්වා දෙන ලදී. අපේ සභාවෙන් එහෙම දේවල් නොකරනවා කියා පහතට දමන්නට කතා කරනවා නොවන බවත් ඔබතුමිය ලස්සනට වචන දාලා ලියලා තිබෙන සංවර්ධනය අපි මේ සභාව තුළින් දැක නැති බවත් අපිට මීට වැඩිය දේවල් හිතලා කරන්නට පුළුවන් බවත් පාරට බැස්ස විට මිනිසුන්ට දැනෙන දේ උහන ප්‍රාදේශීය සභාවෙන් මෙය කරලා තිබෙන්නේ යැයි පැවසිය හැකි දෙයක් කළ යුතු බවත් පෙන්වා දෙන ලදී. අපේ සම්පත් යොදාගෙන කළ හැකි දේ ඕනතරම් තිබෙන බව ප්‍රකාශ කරන ලදී. එමනිසා ලස්සන වචන යෙදීම නොව දැනෙන වැඩක් කළ යුතු බවත් සම්මාන ගන්නට නිලධාරීන් කුලප්පු කරගෙන තටමන දේ වලට මම විරුද්ධ බවත් පෙන්වා දෙන ලදී. නැත්නම් නගරයට බැස මොන සභාවෙන්ද නගරය ලස්සනට හදලා තිබෙන්නේ යන්න බැලිය යුතු බවත් පෙන්වා දෙන ලදී. මිනිසුන්ට දැනෙන දේවල් කරලා තිබෙන්නේ මොන සභාවෙන්ද යන්න සොයා බැලිය යුතු බවත් පෙන්වා දෙන ලදී. මම මේ කා සමඟවත් තරහට කතා නොකරන බවත් ඉදිරියේදීවත් සම්මාන පැත්තකට තබා මිනිසුන්ට දෙයක් කරන්නට පුළුවන්නම් ඒ දෙය කළ යුතු බව පෙන්වා දෙන ලදී. අපි කොච්චර මේ පිළිබඳ කතා කරත් සභාවෙන් පිටට මේවා නොයන බවත් සභාව ඇතුලේ පමණක් ඒවා තිබෙන බවත් පෙන්වා දෙන ලදී. තවද අයවැය කෙටුම්පත අයවැයක් ලෙස සම්මත වන්නට ඡන්දය පාවිච්චි කොට අපි එය සම්මත කර දුන් බව ප්‍රකාශ කරන ලදී. කොහොම හරි අපි එය සංශෝධන සහිත ලෙස සම්මත කර බවත් ප්‍රාදේශීය සභාව තුළින් නිවාස සැලසුම් සහන මිළට ඇඳ ලබා දීම මම යෝජනාවක් ගෙන ආ බවත් එය සභාවේ මන්ත්‍රීවරුන් හොඳයි කියා පිළිගත් බවත් ඒ තුළින් ආදායමක් ලැබෙනවා වගේම ජනතාවට විශාල පහසුවක් වීමද සිදුවන බව පෙන්වා දෙන ලදී. නමුත් මෙය විශාල ගැටළුවක් පැන නැගී මට කිහිප වතාවක් දුරකථන ඇමතුම් ලබා දී කතා කළ බවත් මේක කරන්නට බැහැ යැයි මා හට පැවසූ බවත් මම එමනිසා ඒ ගැන සොයා බැලූ බවත් සභාපතිතුමත් ලේකම්තුමියත් මට බොරු පවසා ඇති බවත් ප්‍රකාශ කරන ලදී. එයට හේතුව සභාවේ කාර්මික නිලධාරීන්ගෙන් මේ පිළිබඳ කරන්නට පුළුවන්දැයි ප්‍රථමයෙන් අසා ඇති බවත් ඒ නිලධාරීන් ඔවුන්ගේ රාජකාරී පැවරීමේ මෙම රාජකාරිය නැති නිසා එය කරන්නට බැහැ යැයි ඔවුන් පවසා ඇති බවත් ප්‍රකාශ කරන ලදී. ඒනිසා මට මේ යෝජනාව දමන්නට බැහැ කියා පැවසූ බවත් ප්‍රකාශ කරන ලදී. අයවැය සම්මත කරනවිට මෙය පිළිඅරගෙන අයවැය ලේඛනයට ඇතුලත් කරන්නට යන අවස්ථාවේදී මෙය කරන්නට බැහැ කියා මා හට කතා කළ බවත් ප්‍රකාශ කරන ලදී.

එවිට මම විරුද්ධ වූ බවත් මෙය අයවැය ලේඛනයට ඇතුලත් කර ක්‍රියාත්මක කරන්නට උත්සාහ කළ යුතු යැයි මා ප්‍රකාශ කළ බවත් පෙන්වා දෙන ලදී. මම රජයේ සේවකයෙක් නොවන නිසා රාජ්‍ය සේවකයින්ගේ නීතිමය පැත්ත නොදන්නා නිසා සොයා බැලූවිට මට දැනගන්නට හැකිවූයේ රැකියා විස්තරයක් තිබුණට සභාපතිවරයා පවරන ඕනෑම දෙයක් කරන්නට ඔවුන් බැඳී සිටිය යුතු බවයි. එය එසේ විය යුතු නේදැයි විමසන ලදී. එය ලේකම්තුමිය හා සභාපතිතුමා නොදැන සිටියා දැයි විමසන ලදී. ඔබ දෙපළ පවසා සිටියේ විමර්ශන නිලධාරියා මෙය කරන්නට බැරි බව පැවසූ බවයි. එම අවස්ථාවේ මා පවසා සිටියේ ලිඛිතව උපදෙස් ඉල්ලා සිටින ලෙසයි. නමුත් මම උපදෙස් ලබා ගත් පුද්ගලයා පැවසුයේ සභාපතිවරයාට රාජකාරී පැවරීම සඳහා බලය තිබෙන බවයි. මේ සම්බන්ධව උපදෙස් ඉල්ලා යවනු ලැබූ ලිපිය හා එයට ලැබුණු පිළිතුරු ලිපිය මා හට බැලීමට ලබා දෙන ලෙසට ප්‍රකාශ කරන ලදී.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.05 ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.ඩී. දර්ශන නුවන් විශ්නදේව මයා පැමිණෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.15 ගරු ප්‍රා.ස.මන්ත්‍රී එන්. අමරකීර්ති මයා පැමිණෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.20 ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී ඩබ්.එම්. සීතා කුමාරිහාමි මිය පැමිණෙන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.30 ගරු ප්‍රා.ස.මන්ත්‍රී ආර්.එම්. ජයවීර රත්නායක මයා හා ඊ.ආර්. සුමනාවතී මිය පැමිණෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මයා.**

ප්‍රාදේශීය සංවර්ධන කමිටු රැස්වීම සඳහා ලිපියක් ලැබුණු බවත් 2022.11.14 දින මෙම රැස්වීම පැවැත්වෙන බවත් 2022.11.11 වන දින පෙ.ව. 10.00 ට පෙර ඊ මේල් හෝ වට්ස්ඇප් අංකයට හෝ අපේ යෝජනා එවන්න යැයි සඳහන් කර ඇති බවත් පෙන්වා දෙන ලදී. එසේම සභාවේ සේවකයෙකු ලවා අපට දුරකථන පණිවිඩයකුත් ලැබුණු බවත් ප්‍රකාශ කරන ලදී. තාක්ෂණය මෙච්චර දියුණු වෙලා තිබිය දී අපේ සභාවේ මන්ත්‍රීවරුන්ගේ වට්ස්ඇප් ගෲප් එකක් හදා ගන්නට බැරිවී ඇති බව ප්‍රකාශ කරන ලදී. එසේ ගෲප් එකක් හදා ගත් විට ඕනෑම පණිවිඩයක් ක්ෂණිකව ලබා දීමට හැකියාව ඇති බව ප්‍රකාශ කරන ලදී. මෙම පණිවිඩය කලින් දැන සිටියානම් අපිට යෝජනාවක් යොමු කරන්නට තිබුණු බවත් ඒ ගැන කණගාටුවෙන් යුක්තව කතා කරන බවත් ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපතිතුමා**

ප්‍රාදේශීය සංවර්ධන කමිටුව ගැන මන්ත්‍රීවරු දැනුවත් කිරීම අපගේ කාර්යයක් නොවන බවත් ඒ සම්බන්ධව ප්‍රාදේශීය ලෙක්ම් කාර්යාලයෙන් ලිඛිතව මන්ත්‍රීවරුන්ට දැනුම් දිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී. එමනිසා ඒ පිළිබඳව කටයුතු කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කෙලින්ම මන්ත්‍රීවරුන්ට ලිඛිතව දැනුම් දීමට කටයුතු කරන ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලිපියකින් දැනුම් දෙන ලෙස ලේකම්තුමියට උපදෙස් දෙන ලදී.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේ ලිපිය අපිට නොලැබුණු බවත් සභාවේ සේවකයෙක් දුරකතනයෙන් එම පණිවිඩය ලබා දුන් නමුත් ලිපියේ අඩංගු විස්තර අපි නොදන්නා බවත් මෙච්චර හොඳ තාක්ෂණයක් තිබිය දී විෂය භාර ලිපිකරුවත් දුරකථනයෙන් කතා නොකළ බවත් සාමාන්‍ය සේවකයෙක් මේ පණිවිඩ ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී. දෙලංකාවල මන්ත්‍රීතුමා පැවසූ ආකාරයට වට්ස්ඇප් ගෲප් එකක් හදලා තිබුණා නම් මෙවැනි අඩුපාඩු නොවන බව පෙන්වා දෙන ලදී. තොරතුරු ලබා දීම හා පණිවිඩ ලබා දීම වගකීමක් තිබෙන නිලධාරියෙකුට පවරන ලෙස ප්‍රකාශ කරන ලදී. සාමාන්‍ය සේවකයෙකුට පැවරූ විට වගකීමක් නැති බව පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී කේ.වී.ජී. නයනා කුමුදුනී මිය.**

සභා වාර්තාවේ 84 පිටුවේ මහ සභාව කාරක සභාවක් බවට පත්වී නැවත මහ සභාවක් බවට පත්වීම සටහන් කර ඇති බවත් කාරක සභා අවස්ථාවේදී සාකච්ඡා කරන කරුණු සම්බන්ධයෙන් ලේකම්තුමිය සභාව දැනුවත් කරන ලද බව සඳහන් කර ඇති නමුත් මේ සභාවේ එදින නොසිටින ලදී සභිකයෙකුට එම අවස්ථාවේදී සාකච්ඡා වූ දේ දැන ගැනීමට හැකියාවක් නොපවතින බවත් කාරක සභා අවස්ථාවේදී සාකච්ඡා කරනු ලබන කරුණු සාරාංශයක් ලෙස සටහන් කිරීම සිදුවිය යුතු බව පෙන්වා දෙන ලදී.

**ගරු සභාපතිතුමා**

ලේකම්තුමිය විසින් රු. 850000.00 ක මුදල අඩුවීම සම්බන්ධව කරන ලද පැහැදිළි කිරීම සභා වාර්තාවේ සංශෝධන යටතේ ඇතුලත් කර ඇති බව සඳහන්ව ඇති බවත් 84 පිටුවේ මාගේ ප්‍රකාශයේ පැහැදිළිව දක්වා ඇති බවත් එය සභා වාර්තාවේ 4 හා 5 පිටුවල නිවැරදිව දක්වා ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මයා.**

අයවැය යෝජනා ඇතුලත් කිරීමේදී සංශෝධනය කරන්නට කියූ කරුණු වලට අමතරව තවත් කරුණු සංශෝධනය වී ඇති බවත් ඉදිරි වර්ෂයේ කරන්නට තිබෙන යෝජනා 17 ක් ඇති බවත් හෙළ බොජුන් හල සම්බන්ධව තිබුනු යෝජනාව නැති බවත් එය සමනබැද්ද ඉදිකර ඇති සභාව සතු ගොඩනැගිල්ල කුලියට දී ආදායම් උත්පාදනය කිරීම ලෙස වෙනස් වී ඇති බවත් එය එසේ සංශෝධනය කරන්නට කවුරුන් හෝ යෝජනාවක් ලබා දුන්නා දැයි විමසන ලදී. අපට හිතෙන හිතෙන ආකාරයට ඒවා වෙනස් කළ නොහැකි බව පෙන්වා දෙන ලදී. කවුරුන් හෝ සංශෝධනය කරන්නට යෝජනාවක් ගෙන ආවානම් එහි ගැටළුවක් නොවන බව පෙන්වා දෙන ලදී.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.35 ගරු ප්‍රා.ස.මන්ත්‍රී පූජ්‍ය උඩවෙල ධම්මතිලක හිමි පැමිණෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

අද මේ සභා වාර්තාව සංශෝධනවලට යටත්ව සම්මතවෙයි. නමුත් මට එය ගැටළුවක් නැති බවත් මේ සභා වාර්තාවේ වචන පිළිබඳ, ඇලපිලි, ඉස්පිලි, පාපිලි හරියාකාරව නැතිව සම්මතවන සභා වාර්තාවට මම විරුද්ධ බව සටහන් කරගන්නා ලෙස ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.එච්. චමින්ද පුෂ්ප කුමාර මයා.**

කමිටු පත් කිරීම් වලදී පුස්තකාල කමිටුවේ 09 කු නියෝජනය කරන බවත් එහිදී සභාපතිතුමා සහ තවත් මන්ත්‍රීවරු 3 කුගේ නම් සඳහන් වන බවත් ඊට අමතරව ලේකම්තුමිය හා තවත් නිලධාරීන් 5 කු සිටින බවත් සියලුම අයගේ නම් වලින් සඳහන් වී ඇති අතර, පුස්තකාල සේවක යන තනතුරින් පමණක් එය සඳහන් වී තිබෙන්නේ කුමන හේතුවක් නිසාදැයි විමසන ලදී.

**ගරු සභාපතිතුමා**

පුස්තකාල තුනේ තුන්දෙනෙකු සිටින බැවින් තුන්දෙනාගෙන් එක් අයෙකු මේ සඳහා සහභාගී කරවා ගැනීමට හැකිවන පරිදි තනතුරින් එය සඳහන් කළ බව පෙන්වා දෙන ලදී. උහන පුස්තකාලයේ පුස්තකාල සේවකතුමිය මේ මස විශ්‍රාම යන බැවින් එතුමියගේ නමින් සඳහන් කළ නොහැකි බවත් එමනිසා තනතුරින් එම කමිටුව සඳහා නම යෙදූ බව පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.එච්. චමින්ද පුෂ්ප කුමාර මයා.**

පුස්තකාලයේ මූලිකත්වය අරගෙන කටයුතු කරන්නට කෙනෙකු නැති නිසාද කොහේද කියවීම් මාසයේදී උත්සවයක් තිබුණු බවත් මටත් ආරාධනා කර තිබුණු බවත් මමත් එතනට පැමිණි බවත් එම උත්සවය ඉතාමත් හොඳට පිළිවෙලට කර තිබුණු බවත් වැඩපිළිවෙල බොහෝම හොඳට තිබුණු බවත් ඒ ගැන මා ආඩම්බර වන බවත් නමුත් ඒ කටයුත්තේදී බොහෝම කණගාටුදායක සිද්ධිදාමයක් මා හද තුළ දරාගෙන මා එළියට බැහැලා ගිය බව ප්‍රකාශ කරන ලදී. කියවීම් මාසය වෙනුවෙන් ගත් උත්සවයේදී ගොඩක් අය ඇගයීමට ලක් කරන ක්‍රියාදාමයක්. වැඩපිළිවලක් හදා තිබුණු බවත් සභාවෙන්ද රු. 30,000.00 ක මුදලක් වෙන් කර පාඨක සමාජය වෙනුවෙන් යම් වැඩපිළිවෙලක් කිරීමට කටයුතු කරනු ලැබූ බවත් පෙන්වා දෙන ලදී. එම අවස්ථාවේදී රාජ්‍ය නිලධාරීන් ඇගයීමට ලක් කරනු ලැබූ බවත් මම එයට වරදක් නොකියන බවත් එය ඉතා හොඳ බවත් නමුත් පාඨක සමාජය වෙනුවෙන් ළමයින්ගෙන් ඉදිරිපත් කිරීම් තිබුණේ එකක් පමණක් බවත් පෙන්වා දෙන ලදී. රාජ්‍ය නිලධාරීන් ඇගයීමට ලක් කළා වගේ මේ පුස්තකාල සම්බන්ධව ඔබතුමාගේ කටින්ම පවසා මේ සභාවේ අත්පොලසන් නඟා පිළිගත් පුද්ගලයෙකු සිටින බවත් මේ පාඨක සමාජයට උදව් කරන පුස්තකාලයට පුදුමාකාර ලෙස බැලමෙහෙවරකම් කරපු උදව් උපකාර කරපු පුද්ගලයෙක් එදා වාඩිවෙලා සිටිය බවත් ඔහු අපේ මන්ත්‍රීවරයෙකු බවත් නමුත් එතුමා ගැන වචනයක්වත් කතා නොකර එතුමා කිසිම ඇගයීමකට ලක් නොකරපු වේදනාව මම අද කතා කිරීමට බලාපොරොත්තුවෙන් සිටි බවත් පෙන්වා දෙන ලදී. එය හරිම වැරදි බවත් පුස්තකාලයට උදව් උපකාර කරන නිසා අපි අත් දෙකම ඔසවා එතුමාට මේ සභාවේදී ආචාර කළ බවත් පෙන්වා දෙන ලදී. නමුත් මේ ගරු උත්තරීතර ජයන්ත මන්ත්‍රීතුමා වෙනුවෙන් සිහිවටනයක් දීමට ඔබතුමාලාට නොහැකි වූ බව කණගාටුවෙන් ප්‍රකාශ කරන බව පැහැදිළි කරන ලදී. සභාවේ මේ උත්සවය දවසේ මෙතුමා යම් ස්ථානයක තබන්නට ඔබතුමාලාට හැකියාව තිබුණු බව පෙන්වා දෙන ලදී. අද මේ උභන ප්‍රදේශයේ දරුවන් වෙනුවෙන් මෙතුමා ලොකු මෙහෙවරක් කරන බවත් පෙන්වා දෙන ලදී. නමුත් මේ සභාවේ පාඨක සමාජය වෙනුවෙන් අනුමැතිය අරගෙන රු. 30000.00 කුත් වෙන් කරගෙන තිබුණු උත්සවේදී ජයන්ත මන්ත්‍රීතුමා ඇගයීමට ලක් නොකරපු බව ප්‍රකාශ කරන ලදී. මේ සභාවේ මන්ත්‍රීවරු ලෙස අප සියලු දෙනාම ලැජ්ජා විය යුතු බවත් මෙය ඉතා දුක් සහගත සිදුවීමක් බව පෙන්වා දෙන ලදී. මම පුස්තකාල කමිටුවට සිටින නිසා මේ ගැන කතා කල බවත් , මම ඒ පිළිබඳව කනගාටුවන බවත් ප්‍රකාශ කරන ලදි.ඇගයීමට ලක්කල පුද්ගලයන් ගැන දොස් නොකියන බවත් , නමුත් ප්‍රථමයෙන්ම ඇගයීමට ලක්කල යුත්තේ ජයන්ත ලාල්සිරි මන්ත්‍රීවරයා බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එල්.ආර්.චන්ද්‍රසේකර බණ්ඩාර මයා.**

ගරු සභාපතිතුමනි, අපි දැන් නැගිටලා යන බවත් , මේ සභාවේ රීතියට අනුව වැඩ නොකරන බවත් සභා වාර්තාව සම්මත කර ගන්නේ නැතිව වෙන වෙන දේවල් කතා කරන බවත් පෙන්වා දෙන ලදි.

**ගරු සභාපතිතුමා**

කියවීම් මාසයේදී කරනු ලැබූ උත්සවයේ දී සිදුවූ අඩුපාඩුව පිලිගන්නා බවත් , මා එය ජයන්ත මන්ත්‍රීතුමා සමග කතා කල බවත් , එතුමා පුස්තකාලයට විශාල මෙහෙයක් සිදුකල මන්ත්‍රීවරයෙකු බවත් පෙන්වා දෙන ලදි. ඉදිරියේදී එතුමා අගය කිරීමට ලක් කිරීමට බලාපොරොත්තු වන බවත් ප්‍රකාශ කරන ලදි.මෙය සභා වාර්තාව ස්ථිර කරගත යුතු වේලාව බැවින් රීති අනුව කටයුතු කලයුතු බවත් සභා වාර්තාවේ අඩුපාඩු තිබේනම් ඒවා පෙන්වා දෙන ලෙසත් ,මෙවැනි කතා පසුව කතා කරන ලෙසත් ප්‍රකාශ කරන ලදි.සභා වාර්තාව ස්ථිර කිරීමට කටයුතු යොදන ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රීනී ඩබ්. රාණි මැණිකේ මිය.**

සභා වාර්තාවේ 17 වන පිටුවේ මන්ත්‍රී යෝජනාවල හෙළ බොජුන් හලක් පවත්වාගෙන යාම යැයි සඳහන්ව ඇති බවත් , එය සභාව සතු ගොඩනැගිල්ලක් කුලියට දීම ලෙස වෙනස් විය යුතු බව පෙන්වා දෙන ලදි.

**ගරු සභාපතිතුමා**

දෙලංකාවල මන්ත්‍රීතුමා විමසා සිටියේ හෙළ බොජුන් යන එක වෙනස් කරන්නට යෝජනා දුන්නේ කවුද යන්නයි.ඔබ තුමිය පවසා සිටිනුයේ හෙල බොජුන් හලක් නොව සභාව සතු ගොඩනැගිල්ල කුලියට දීම ලෙස වෙනස් විය යුතු බවයි.අපි සාකච්ඡා කර විසඳුමකට පැමිණියේ එම ගොඩනැගිල්ලේ හෙල බොජුන් යන සංකල්පය නොමැතිව සභා ගොඩනැගිල්ල කුලියට ලබා දී ආදායමක් ගැනීම බව පෙන්වා දෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

මෙය පටන් ගන්නේ ශ්‍රියානි විජේවික්‍රම මැතිණිය බවත්,මෙහි මූලික පරමාර්ථය වූයේ හෙල බොජුන් හලක් බවත් , ලංකාව පුරා හෙල බොජුන් කියා රැල්ලක් ගිය බවත් ,එයට සමගාමීව මෙය ක්‍රියාත්මක වූ බවත් , නමුත් ප්‍රායෝගිකව එතන තිබෙන සම්පත් වල ප්‍රශ්නයක් නිසා මෙය වෙනම ක්‍රමයකට යා යුතු බව තීරණය වූ බවත් , පෙන්වා දෙන ලදි.කඩ කාමර කියන සංකල්පයට මෙය ගෙන යනවාට මා විරුද්ධ බවත් , එසේ වූ විට උහන නගරයේ තිබෙන කඩ කාමර වගේ අයිතිවාසිකම් කියන්නට පැමිනේවි යැයි ප්‍රකාශ කරන ලදි.එසේ නොවී අපේ අයිතිය තබා ගෙන රාජකාරිය හරියට කරන්නේ නැත්නම් සතියකින් හෝ එළියට දමන්නට පුළුවන් ආකාරයට ඒ අවට සිටින අයට මොනවා හෝ ව්‍යාපාරයක් කරගෙන යන්නට පුළුවන් ආකාරයට පරිසරය සකස් කොට දිය යුතු බව ප්‍රකාශ කරන ලදි.

ඔරලෝසු වේලාවෙන් පෙ.ව.10.35 ගරු උප සභාපති එච්.එම්. ජගත් දේශප්‍රිය අබේවර්ධන මහතා පැමිණෙන ලදි

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මයා.**

ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ තිබෙන රැස්වීම් වල කටයුතු සම්බන්ධව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් දැනුම් දෙන ලෙස ප්‍රකාශ කර ලිපියක් යවන්න යැයි ඔබතුමා ලේකම්තුමියට ප්‍රකාශ කල නිසා මෙය පවසන බවත් , නමුත් මන්ත්‍රීවරයාගේ , මන්ත්‍රීවරියගේ අභිමානය තිබෙන බවත් , රාජ්‍ය නිළධාරීන් විසින් මන්ත්‍රීවරු කියන නම හැල්ලුවට ලක්කරන්නට හදනවානම් එයට ඉඩ නොදිය යුතු බවත් ,මන්ත්‍රීවරයාගේ ගෞරවය මේ තුළ රැකිලා තිබෙන්නට ඕන බවත් ,එම නිසා මේ ගැටළුව අලුත් ප්‍රාදේශිය ලේකම් වරයාට ඔබතුමා විසින් පැහැදිලි කිරීම සිදුවිය යුතු බවත් , රැස්වීමකට ගිය විට සභාපතිවරයා එම රැස්වීමේ සිටියත් , පිළිගැනීමේදී එතුමා මුලින්ම පිළි නොගෙන වෙන අය පිළි ගන්නා බවත් , එසේ නොවී පෙළගැස්මේදී කවුරු කැමති වුනත් ,කවුරු අකමැති වුනත් , දේශපාලඥයාට පලමු තැන හිමිවිය යුතු බවත් , ඒ පිළිබඳ පැහැදිලි කර දෙන ලෙස ප්‍රකාශ කරන ලදි.ගරු විමලවීර දිසානායක මැතිතුමා එම කටයුත්ත හරියටම , නිවැරදිව සිදුකරන බවත් , මන්ත්‍රීවරු දසදෙනෙකු සිටියත් නම් වශයෙන් පවා පිළිවෙලට කියා එම කාර්ය සිදු කරන බවත් ,පෙන්වා දෙන ලදි. ප්‍රාදේශිය ලේකම්තුමා අළුත් නිළධාරියෙක් නිසා ඔබතුමා විසින් එය පැහැදිලිකර පෙන්වා දෙන ලෙස ප්‍රකාශ කරන ලදි.අපෙන් හරි කොළ ටිකක් මුද්‍රණය කර මන්ත්‍රීවරයාගේ නම් ලබා දීම සිදු කරන ලෙසත් එසේ කටයුතු සිදු නොවනවානම් අපි රැස්වීම වර්ජනය කලයුතු බවත් පෙන්වා දෙන ලදි.අපි එයට හේතුව පැහැදිලි කලයුතු බව පෙන්වා දෙන ලදි.මේ සියල්ල නිවැරදි කර ගතයුතු බව ප්‍රකාශ කරන ලදි.අපේ මන්ත්‍රීවරු 31 දෙනාගෙම නම , ලිපිනය, දුරකතන අංකය සඳහන්කර රැස්වීම දැනුම් දෙන ලෙස ලිඛිතව ලිපියක් යවන ලෙස ප්‍රකාශ කරන ලදි.එසේම මේ සභාවේ තිබෙන රැස්වීම් , උත්සව අපට දැනුම්දීම සිදු නොකරන බවත් ,හෙට වැනි දිනක එවැනි දෙයක් තිබෙනවානම් සභාපතිතුමා දුරකතනයෙන් හවසට පවසා සිටින බවත් ,එවැනි සිදුවීම් දෙකක් මම මඟ හැරිය බවත් , එන්න පුළුවන් කම හොඳටම තිබියදී නොපැමිණි බවත් ඒතරම් පහතට වැටෙන්නට මම අකමැති බවත් ප්‍රකාශ

කරන ලදි. LDSP ව්‍යාපෘතියෙන් පොලට ලැබෙන මුදල සම්බන්ධව තීරණ ගැනීමට සුදු ජාතිකයෙක් පැමිණෙන බව සභාපතිතුමා ඊට කලින් දින පැවසූ බවත් , කීයටදැයි මම විමසූ විට 10.30 හෝ 11.30 විතර ඒවි යැයි මට පැවසූ බවත් , පසුව ඔබතුමා ඒ අවස්ථාවට දුරකතන පණිවිඩයක් දෙන්නම් යැයි පැවසූ බවත් එතුමා එහෙම පැවසූ නිසා මාගේ වැඩ කටයුතු වලට යන්නේත් නැතිව බලා සිටි බවත් ,10.30 ට පමණ මා විශාකා එකට යන විට ලේකම්තුමිය හා පිරිසක් පොළ හදන ස්ථානයේ සිටි බවත් , සුදු ජාතිකයාත් එතන සිටි බව ප්‍රකාශ කරන ලදි.මට එන්න කියලා දුරකතන ඇමතුමක් දෙනවා කිව්වාට දුරකතන ඇමතුම නොලැබුන බවත් , සුදු ජාතිකයා ඒ වන විට ඇවිත් නිසා මම නැවත කඩයට පැමිණිය බවත් ටික වේලාවකින් සභාපතිතුමා කැබ් රථයේ ගිය බවත් ,එම නිසා මම දුරකතන ඇමතුමක් එතුමාට අරගෙන තාම නැද්ද කියා විමසූ බවත්,එතුමා එවිට ඉක්මනට එන්න යැයි පැවසූ බවත් එවිට බෙර සද්ද ඇහුන බවත් ප්‍රකාශ කරන ලදි.මම කතා කල නිසා මෙතුමා මට එන්න කිවූ බවත් , දැන් ඉතින් එම කාර්ය සිදුවෙමින් පවතින නිසා නැවත දුරකතන ඇමතුමක් ගන්නා විටත් බෙර ගසන ශබ්ද ඇසුන බවත් ඒ තරම් පිළිගැනීමක් සිදුවෙමින් තිබුන බවත් එය පොඩි වැඩක් නොවන බව පැහැදිලි වූ බවත් ප්‍රකාශ කරන ලදි.එම නිසා මම එතනට නොඑන බව පවසා මාගේ වැඩ කටයුතු සඳහා මම ගිය බවත් ප්‍රකාශ කරන ලදි.

**ගරු සභාපතිතුමා**

සභා වාර්තාව ස්ථිර කර ගන්නා ලෙසත් ,න්‍යාය පත්‍රයට අනුව කටයුතු කලයුතු බවත් , රීති වලට අනුව සභාව ඉදිරියට යායුතු බවත් ,ප්‍රකාශ කරන ලදි.සභා වාර්තාවේ අඩු පාඩු සාකච්ඡා කල යුතු අවස්ථාවේ වෙන වෙන දේවල් කතා කිරීම රීති විරෝධී බව පෙන්වා දෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මයා.**

ඔබතුමා ලේකම්තුමියට පැවසුයේ ලිපි ගහන්න එපා කියා එම කරුණට අදාලව කතා කරන බවත් ,එම ලිපි මෙවැනි අවස්ථාවන්වලට ගැසීම සිදුවිය යුතු බව පෙන්වා දෙන්නට මේ කරුණු ඉදිරිපත් කරන බව ප්‍රකාශ කරන ලදි.මෙවැනි දේ ප්‍රකාශ කල පසු ඉදිරියේදී හෝ අඩුපාඩු සකස්කර ගනීවි යැයි ප්‍රකාශ කරන ලදි.ලොකු උත්සවයක් අවස්ථාවේදී වත් අපට ලිඛිතව දැනුම් දෙන ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු සභාපතිතුමා**

ප්‍රාදේශිය සංවර්ධන කමිටු රැස්වීම පිළිබඳව සියළුම මන්ත්‍රීවරුන් දැනුවත් කරන ලෙස මා විසින් ප්‍රාදේශිය ලේකම් තුමාට ප්‍රකාශ කර සිටි බවත් ,සියළුම මන්ත්‍රීවරුන්ට පුටුවක් බැගින් වෙන් කරන ලෙසද ප්‍රකාශ කර සිටි බවත් ,එම නිසා සියළුම මන්ත්‍රීවරුන්ට එම අවස්ථාවට පැමිණෙන ලෙස එතුමා දන්වා සිටි බවත් ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.එච්. චමින්ද පුෂ්ප කුමාර මයා.**

සියළුම මන්ත්‍රීවරුන්ට ආරාධනා කරන ලෙස ඔබතුමා පැවසූ බව කියා සිටියත් , මෙපමණ කාලයකට එක්සත් ජාතික පක්ෂයේ කිසිම මන්ත්‍රීවරයකුට කවදාවත් ආරාධනා නොකල බවත් ,මෙ වර අපට ආරාධනා කල බවත් , එයත් අප විසින් ප්‍රාදේශිය සංවර්ධන කමිටු රැස්වීමට සහභාගී කර ගන්නා ලෙස ලිඛිතව හා වාචිකව ජනාධිපති තුමාගෙන් ඉල්ලීමක් කලනිසා ප්‍රාදේශිය ලේකම් වරුන්ට ලිඛිතව ඒ බව සඳහන්කර ලිපියක් නිකුත් කිරීම නිසා බවත් පෙන්වා දෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රීනී ඩබ්. රාණි මැණිකේ මිය.**

ප්‍රාදේශිය සංවර්ධන කමිටුවේදී මන්ත්‍රීවරු අපහසුතාවයට පත් වූ බවත් මන්ත්‍රීවරු 31 දෙනාටම අසුන්ගතහැකි වන පරිදි කටයුතු සිදුවිය යුතු බවත් ,සභාපතිතුමා මේ පිළිබඳව අවධානය යොමුකර ඉදිරියේදී කටයුතු සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

මන්ත්‍රීවරු 31දෙනෙකු සිටින බවත් ,ග්‍රාම නිළධාරීන් 55ක් සිටින බවත් ,සංවර්ධන නිළධාරීන් 55ක් සිටින බවත් ,තවද වෙළද සංගම් ආදී දේත් තිබෙන බවත් ,ඔය සේරම සිටින විට එම ස්ථානය පහසුකම් මදිවිය හැකි බවත් ,පහසුකම් සැපයීමට අපහසු තත්වයක් තිබෙන්නට ඇති බව පෙන්වා දෙන ලදි. මේ ප්‍රාදේශිය සංවර්ධන කමිටුවේ සභාපති වන ගරු විමලවීර දිසානායක මැතිතුමාට අපි අපහසුතාවයට පත්වීම පැහැදිලිව සදහන් කොට හා මේ සියළුදෙනා ගෙන්වා රැස්වීම් කරන්නට පහසුකම් මදි බවත් පෙන්වා උහන සංස්කෘතික මධ්‍යස්ථානයට අවශ්‍යය පහසුකම් ටික සකස්කර සභාවෙන් අද දින සිදුවූ ඉල්ලීමක් ලෙස සකස් කර ඔබතුමා ලිඛිතව ඉල්ලීමක් කරන ලෙස ප්‍රකාශ කරන ලදි.එහි පිටපත් දිසාපතිතුමාට හා ප්‍රාදේශිය ලේකම් තුමාට යෙමු කරන ලෙස ප්‍රකාශ කරන ලදි.අපි එතනට යනවිට න්‍යාය පත්‍රයවත් අපට නොලැබෙන බවත් සදහන් කර ඇමතිතුමාට ලිපියක් යවන ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මයා.**

කමිටු පිළිබද ප්‍රශ්නයක් ඇති බවත් ,මුදල් හා ප්‍රතිපත්ති කමිටුව , නිවාස කමිටුව , ප්‍රසම්පාදන කමිටුව යන වැදගත් කමිටු නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් සිදුකලයුතු බවත් , එම කමිටු වලදී මන්ත්‍රීවරු පැමිණෙනතුරු ගොඩක් වෙලා බලාගෙන සිටින්නට සිදුවන බවත්, ඒ වගකීම අරගෙන කැමැත්තෙන් කරන්නට පුළුවන් මන්ත්‍රීවරු මේ ප්‍රධාන කමිටු වලට දැමිය යුතු බවත් , විශේෂයෙන් ප්‍රසම්පාදන කමිටුවට 11 දෙනෙකුගේ නම් දැමීම සුදුසු බවත් , දැන් 09 දෙනෙකු පමනක් සිටින බවත් , හැකියාවක් තිබේනම් ජොෂ්ඨ මන්ත්‍රීවරු දෙදෙනෙකුගේ නම් එයට ඇතුලත් කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදි.අත්දැකීම් තිබෙන , යමක් හිතලා කරන්නට පුළුවන්, සහභාගී වන්නට පුළුවන් මන්ත්‍රීවරු ඇතුලත් කරන්නට කියන්නේ ඔබතුමාගේ යහපතට බව පෙන්වා දෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එල්.එච්.කරුණාසේන දයාතිලක මයා විසින් සංශෝධන සහිතව සභා වාර්තාව ස්ථිර කරන ලදි.**

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මහතා හැර එම අවස්ථාවේ පැමිණ රැදී සිටි සියලු මන්ත්‍රීවරුන්ගේ කැමැත්ත මත සභා වාර්තාව සම්මත විය.**

ඔරලෝසු වේලාවෙන් ප.ව. 11.20 තේ විවේකය සදහා සභාව කල් තබන ලදි

ඔරලෝසු වේලාවෙන් ප.ව. 11.45 තේ විවේකයෙන් පසුව නැවත සභාව ආරම්භ කරන ලදි.

**03.ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන -**

**ගරු සභාපතිතුමා**

ගරු ප්‍රාදේශිය සබා මන්ත්‍රී විමලරත්න මහතා මාගෙන් ප්‍රශ්නාවලියක් අසා තිබුන බවත් ,එම ප්‍රශ්න වලට පිළිතුරු යතා පරිදි කල් දී ඇති ප්‍රශ්න අවස්ථාවේදී ලබා දෙන බවත් ඔබතුමා අසන ලද ප්‍රශ්න වලට සම්බන්ධ වන ලිපියක් වන වයි.වී.ඒ.දිස්නා ජානකී මියගේ සහික දීමනා ගෙවීම සම්බන්ධව උහන ප්‍රාදේශිය සභාවෙන් පලාත් පාලන සහකාර කොමසාරිස් තුමාගෙන් උපදෙස් ඉල්ලා ලිඛිතව යැවූ ලිපිය සම්බන්ධව පලාත් පාලන සහකාර කොමසාරිස් තුමා විසින් පලාත් පාලන කොමසාරිස් තුමාගෙන් උපදෙස් ඉල්ලා යොමු කරන ලද ලිපිය මන්ත්‍රීවරුන්ට දැනගැනීම සදහා සභාගත කරන ලදි.

පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය - අම්පාර

உள்ளூராட்சி உதவி ஆணையாளர் அலுவலகம் - அம்பாறை

OFFICE OF THE ASSISTANT COMMISSIONER OF LOCAL GOVERNMENT – AMPARA

Address : Kachchery Road, Ampara. Tel : 063 22 22 687 Fax : 063 22 22 216

Email : ampaclg@yahoo.com, ampaclg@gmail.com, ampaclgact@yahoo.com

AM/ACLG/AD/A5/Member/2022

2022.11.04

පළාත් පාලන කොමසාරිස්,
පළාත් පාලන දෙපාර්තමේන්තුව,
නැගෙනහිර පළාත,
ත්‍රිකුණාමලය.

ප්‍රාදේශීය සභාව
11 NOV 2022

**සභික දීමනා ගෙවීම සම්බන්ධව - වයි.වී.ජ්. දිස්නා ජානකී මිය**

උක්ත කරුණට අදාලව උහන ප්‍රාදේශීය සභා ලේකම් විසින් මා වෙත යොමු කරන ලද UPS/ADMN/01/2022 අංක දරණ 2022.10.25 දිනැති ලිපිය හා බැදේ. (අදාල ලිපිවල පිටපත් මේ සමග අමුණා ඇත.)

02. එමගින් උහන සභාවේ සභිකාවරියක ලෙස කටයුතු කළ ඉහත නම සඳහන් අය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයකුව සිටීම අවසන් කර ඇති බැවින්, ඇයගේ සභිකධූරය අතහැර ඇති බව අති විශේෂ ගැසට් පත්‍ර අංක 2274/36 හා 2022.04.08 දිනැති ගැසට් පත්‍රය මගින් අම්පාර සහකාර මැතිවරණ කොමසාරිස් ප්‍රකාශයට පත් කර ඇති බව සඳහන් කර ඇත.

03. තවද, 2022.04.07 දින පවත්වන ලද ප්‍රාදේශීය සභා මහ සභා රැස්වීම සඳහා ඇය සහභාගී නොවූ බවත්, අසනීප තත්ත්වයෙන් පසුව ප්‍රතිකාර ලබා ගැනීමට අවශ්‍ය බව පවසා ඇය විසින් ලිපියකින් දන්වා ඇති බවත්, 2022.10.14 දින ලිපියක් මගින් 2022 අප්‍රේල් මාසයට අදාල දීමනාව ලබා දෙන ලෙස ඉල්ලීම කර ඇති බැවින් අප්‍රේල් මස දීමනාව ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳව උපදෙස් ඉල්ලා ඇත.

04. ඒ අනුව, මේ සම්බන්ධව අවශ්‍ය උපදෙස් ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

එස්.එල්.ඒ. කමල් නෙත්මිණි,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
අම්පාර.

එස්.එල්.ඒ. කමල් නෙත්මිණි
පළාත් පාලන සහකාර කොමසාරිස්

පිටපත්-
01. ලේකම්, ප්‍රාදේශීය සභාව, උහන - දැ.ස.

**ගරු සභාපතිතුමා.**

උහන කඩ කාමර අලුතින් තක්සේරු කල බවත් , ඒ තක්සේරු කරන ලද මිල ගනන් දැන ගැනීම සඳහා ඔබ සියළුදෙනාටම ලබාදුන් බවත්, එම ලිපිය අද දිනයේ සභා ගත කරන බවත් ප්‍රකාශ කරන ලදී.

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව

அரசாங்க மதிப்பீட்டுத் திணைக்களம்

DEPARTMENT OF GOVERNMENT VALUATION

නැගෙනහිර පළාත් කාර්යාලය | கிழக்கு பிராந்திய அலுவலகம் | Eastern Regional Office

30, කොලට් පටුමඟ, මඩකලපුව.
30, கொலட் ஒழுங்கை, மட்டக்களப்பு.
30, Collete Lane, Batticaloa.

විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail: cv@valuationdept.gov.lk
Web: www.valuationdept.gov.lk

කාර්යාලය / அலுவலகம்: 065-2223469

ෆැක්ස් / பெக்ஸ் / Fax: 065-2223469


ප්‍රාදේශීය සභාව
16 NOV 2022
උහන.

මගේ අංකය / எனது இல. / My No.: AM/RP/627

ඔබේ අංකය / உமது இல. / Your No.: UPS/Admin/Rev/03/2022

දිනය / திகதி / Date: 15.11.2022

The Secretary
Pradeshiya Sabha
Uhana

**Assessment of Minimum Monthly Market Rents of for shops rooms in Public Market at Uhana**

Reference to your Letter dated 28th September 2022 regarding for the above subject,

2.0 The minimum monthly market rents for the shop rooms in the public market bearing No. 3 to 3/22 Mahaoya Road, situated in the village of Uhana within the Predeshiya Sabha and Divisional Secretariat limits of Uhana in Ampara District, Eastern Province is assessed and reported as follows,

| S.No | Shop No | Minimum Monthly Rent |
|---|---|---|
| 1. | 01 | Rs. 6,400/= (Rupees Six Thousand Four Hundred only) |
| 2. | 02 | Rs. 6,400/= (Rupees Six Thousand Four Hundred only) |
| 3. | 03 | Rs. 6,400/= (Rupees Six Thousand Four Hundred only) |
| 4. | 04 | Rs. 6,400/= (Rupees Six Thousand Four Hundred only) |
| 5. | 05 | Rs. 6,400/= (Rupees Six Thousand Four Hundred only) |
| 6. | 06 | Rs. 6,400/= (Rupees Six Thousand Four Hundred only) |
| 7. | 07 | Rs. 6,400/= (Rupees Six Thousand Four Hundred only) |
| 8. | 08 | Rs. 6,400/= (Rupees Six Thousand Four Hundred only) |
| 9. | 09 | Rs. 6,400/= (Rupees Six Thousand Four Hundred only) |
| 10. | 10 | Not requested |
| 11. | 11 | Not requested |
| 12. | 12. | Not requested |
| 13. | 13. | Not requested |
| 14. | 14. | Rs. 7,300/= (Rupees Seven Thousand Three Hundred only) |
| 15. | 15. | Rs. 7,300/= (Rupees Seven Thousand Three Hundred only) |
| 16. | 16. | Rs. 7,300/= (Rupees Seven Thousand Three Hundred only) |
| 17. | 17. | Rs. 7,300/= (Rupees Seven Thousand Three Hundred only) |
| 18. | 18. | Rs. 7,600/= (Rupees Seven Thousand Six Hundred only) |
| 19 | 19 | Rs. 7,600/= (Rupees Seven Thousand Six Hundred only) |
| 20. | 20. | Rs. 7,600/= (Rupees Seven Thousand Six Hundred only) |
| 21 | 21 | Rs. 7,600/= (Rupees Seven Thousand Six Hundred only) |
| 22 | 22 | Rs. 7,600/= (Rupees Seven Thousand Six Hundred only) |
| 23 | 23 | Rs. 7,300/= (Rupees Seven Thousand Three Hundred only) |

L.J.D.K. Silva
Deputy Chief Valuer


රජයේ ප්‍රධාන තක්සේරුකරු / அரசாங்க பிரதம மதிப்பீட்டாளர் / Government Chief Valuer: 011-2695533

අතිරේක ප්‍රධාන තක්සේරුකරු / மேலதிக பிரதம மதிப்பீட்டாளர் / Additional Chief Valuer: 011-2693658

ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු / சிரேஷ்ட மதிப்பீட்டாளர் / Senior Valuer: 065-2225646

තක්සේරුකරු / மதிப்பீட்டாளர் / Valuer: 065-2223469


*"වෘත්තීය විශිෂ්ටත්වය කරා"*
*"தொழில்சார் நிபுணத்துவத்தை நோக்கி"*
***"Let Us Achieve Professional Excellence"***

**ගරු සභාපතිතුමා**

දෙසැම්බර් 31 වන දින වන විට උහන කඩ කාමර ටෙන්ඩර් කර අවසන් කරන බවත් , ජනවාරියේ සිට නව තක්සේරු මිල ගණන් යටතේ කඩ කාමර කුලියට දීම සිදු කරන බවත් ප්‍රකාශ කරන ලදි.දැන් සිටින අයට ඔය තක්සේරු මුදලට කඩ කාමර ලබා දීමට හැකිවන පරිදි සභා තීන්දුවක් ගැනීම සුදුසු බව පෙන්වා දෙන ලදි.කඩ කාමර අංක කර ඇති ආකාරය ඔබතුමාලාට ගැටළුවක් පැවතිය හැකි බවත් කඩ කාමර අංක 01 පටන් ගන්නේ සභාවේ පොදු වැසිකිලිය ළඟතිබෙන කඩ කාමරය බවත් ,කඩ කාමර අංක 23 අවසන් වන්නේ නීල් යන අයගේ පලතුරු කඩය ලගින් බවත් ප්‍රකාශ කරන ලදි.ඕනම කෙනෙකුට නව තක්සේරු මුදලට ටෙන්ඩර් භාරදිය හැකි බවත් , සභාවේ සාකච්ඡාවන කරුණු අනුව සභා අනුමැතියක් රැගෙන දැනට සිටින පුද්ගලයන්ටම නව තක්සේරු මුදල යටතේ කඩ පවත්වාගෙන යා හැකි බවත් ප්‍රකාශ කරන ලදි.යෝජනාවක් නොවුනත්, දැනුම් දීමක් වුනත් ඒ පිළිබඳ සාකච්ඡා කිරීමට කිහිප දෙනෙකුට අවස්ථාව දෙන බව ප්‍රකාශ කරන ලදි. ඊළඟට කල යුත්තේ කුමක්ද යන්න කිහිප දෙනෙක් අදහස් දැක්වීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මයා.**

මේ සම්බන්ධව මට ගැටළුවක් නැති බවත් ඔබතුමා පවසා සිටියේ දැන් ඉන්න පුද්ගලයන්ටම කඩ කාමර දෙන්න හැකිද කියා සභාවෙන් තීන්දුවක් ගන්නා ලෙසයි. ඒ පුද්ගලයන්ට වුවත් මේ ගැන බලන විට නගරයේ අනිත් කඩ කාමර වල මිල ඉතා අධික බවත් රුපියල් 30000.00 ඉහළ පුද්ගලික කඩ කාමර කුලියට දෙන බවත් සභාවේ කඩ කාමර වල පහසුකම් අඩු බව ඇත්ත බවත් පෙන්වා දෙන ලදි. බොහෝ දෙනෙකුගේ මතය වන්නේ සභාවේ කඩ කාමර තිබෙන ස්ථානය වෙළඳාම අඩු බවත්, ඒ මතය තක්සේරු කරන නිලධාරීන් තුලත් තිබෙන්නට ඇති බවත්, එම නිසා කඩ කාමරයක් 7600.00 ක වැනි මුදලකට තක්සේරු කරන්නට ඇති බවත් පෙන්වා දෙන ලදි. නමුත් මාගේ අදහස නම් තරුණ ව්‍යාපාරිකයින් අලුත් අලුත් දේවල් හඳුන්වා දී ව්‍යාපාරිකයෝ විශාල සංඛ්‍යාවක් එම ස්ථානයට යොමු වුනොත් එම ස්ථානය නගරයේ අනිත් ස්ථාන වලට වඩා දියුණු කරන්නට හැකි බවත්, එයට හේතුව කඩ කාමර 23 ක් යනු හොඳ වෙළඳාමක් හදන්නට පුලුවන් තැනක් බව පෙන්වා දෙන ලදි. එම නිසා මේක අවතක්සේරු කර අඩු මුදලකට යනවාට වඩා තරඟකාරිත්වයක් ඇති කර ටෙන්ඩර් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි. ටෙන්ඩර් මණ්ඩලයට අවසාන තීන්දුවක් ගත හැකි වන පරිදි අපි සාකච්ඡා කර තීන්දුවක් ගත යුතු බව ප්‍රකාශ කරන ලදි. දැනට සිටින ව්‍යාපාරිකයින්ට වැඩි වාසියක් වන කොන්දේසියක් හදන්නට පුලුවන්ද කියන එක සාකච්ඡා කල යුතු බව ප්‍රකාශ කරන ලදි. කඩ ටෙන්ඩර් කිරීමේ දී අතුරු බදු අරගෙන තිබෙන අයට ටෙන්ඩර් කරන්න යැයි විශේෂ මතක් කිරීමක් සිදු කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදි. කඩ කාමර ටෙන්ඩර් කිරීමේදී කඩය වෙන කෙනෙකු විසින් අරගෙන තවත් කෙනෙකුට අතුරු බදු දීමට අවස්ථාව ලබා නොදිය යුතු බවත් දැනට සභාවේ කඩ කාමර කුලියට රැගෙන වෙනත් අයට ඊටවඩා වැඩි මුදලකට කුලියට දෙන අය සිටිනබවත් , එසේ නොවී දැනට කඩ පවත්වාගෙන යන අයට කෙලින්ම ටෙන්ඩර් කර කබ කාමර ලබා ගන්නා ලෙස දැනුවත් කරන ලෙස ප්‍රකාශ කරන ලදි.සමහරු පරම්පරා ගතව මෙය රැගෙන යන බවත් ඒවා වෙනස් කරන ලෙසත් ප්‍රකාශ කරන ලදි.මෙම කඩ කාමරවල පවත්වාගෙන යා නොහැකි ව්‍යාපාර තිබෙන නිසා ඒ පිලිබඳවත් දැනුවත් කරන ලෙස ප්‍රකාශ කරන ලදි.

**ගරු සභාපතිතුමා.**

සැලුන් හා ගරාජ් එම කඩ කාමර වල පවත්වාගෙන යා නොහැකි බව පෙන්වා දෙන ලදි.ටෙන්ඩර් නෝටිස් එකට අපි ඒවා ඇතුලත් කර ප්‍රසිද්ධ කරන බව ප්‍රකාශ කරන ලදි.දෙසැම්බර් මාසයේ ටෙන්ඩර් කර ජනවාරි මාසයට මේවා ක්‍රියාත්මක විය යුතු බව පෙන්වා දෙන ලදි.ඔබ සියළුදෙනා ඔබතුමාලා දන්නා කියන අය දැනුවත් කරන ලෙසත් ටෙන්ඩර් කරන දිනය ගැන මන්ත්‍රීවරු 31 දෙනාම දැනුවත් කරන ලෙස ලේකම් තුමියට පවසන ලදි. මේ සම්බන්ධව මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකුගේ අදහස් බලාපොරොත්තු වන බව ප්‍රකාශ කරන ලදි.

**ගරු උපසභාපති එච්.එම්.ජගත් දේශප්‍රිය අබේවර්ධන මයා.**

කඩ කාමර ගැන කතා කිරීමේදී වැරන්කැටගොඩ කඩ හා උභන කඩ කාමර තිබෙන බවත් , අවුරුදු ගණනාවක් පාඩු පිට වෙළඳාම් කර යම් ස්ථාවරයක් දැන් ගොඩනගාගත් පුද්ගලයින්ට කඩ ටෙන්ඩර් කිරීම සිදු කිරීම තුලින් කඩය අහිමි වුවහොත් ඒ පිලිබඳ ලොකු හානියක් වන බවත් ප්‍රකාශ කරන ලදි.උදාහරණයක් ලෙස 28 කඩකාමරයක සිටින මුණසිංහ ගත් විට අවුරුදු 12 ක් එම කඩ කාමර වල වෙළඳාම සිදු කරන බවත් , මුලදී පාඩුපිට ව්‍යාපාරය පවත්වාගෙන ගොස් ලගකදී සිට යම් ස්ථාවරයකට පැමිණ ඇති බවත් , කඩ ටෙන්ඩර් කිරීම තුළින් රු.200.00 ක් පමණ වැඩිපුර ඉල්ලුම් කල පුද්ගලයකුට කඩ කාමරය ගියහොත් ,අවු 12 ක් සිට හදාගත් පදනම එක මොහොතකින් නැති වී යන බව පෙන්වා දෙන ලදි.එම නිසා හිටපු කඩ හිමියන්ට යම් සාධාරණයක් ඉෂ්ඨවන ආකාරයට යම් යෝජනාවක් හදා සභා තීන්දුවක් ගත යුතු බව ප්‍රකාශ කරන ලදි.අතුරු බදු දීපු අයට එහෙම නොදී කඩය පවත්වාගෙන යන අයට යම් සහනයක් වන ආකාරයට තීන්දුවක් ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි.හිටපු කෙනාට අනිවාර්යයෙන් යම් වාසියක් දිය යුතු බවත් සියළුදෙනා සාකච්ඡාකොට ඒ පිළිබද තීන්දුවක් ගතයුතු බවත් ප්‍රකාශ කරන ලදි.කඩය ලබාගත් පුද්ගලයාට කඩය කරනවානම් එම පුද්ගලයාට සහනයක් ලබා දිය යුතු බව ප්‍රකාශ කරන ලදි.සමහරු ගෙදරින් ගෙනා දේපල වගේ කටයුතු කරන බවත්, මේවා සභාවේ දේපල බව අවබෝධ විය යුතු බවත් ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී කේ.වී.ජී.නයනා කුමුදුනී මිය.**

වැරන්කැටගොඩ කඩකාමර වල අතුරු බදු ව්‍යාපාරිකයින් නොමැති බවත් ඔවුන් අවුරුදු 03 ක් පමණ ඉතාමත් පාඩු පිට වෙළඳාම් කරන බවත් ඔවුන් ගොඩනගාගත් ව්‍යාපාරය කඩ ටෙන්ඩර් කිරීමේ දී රුපියල් 100.00 ක හෝ රුපියල් 50.00 ක වෙනසක් නිසා අහිමිවී ගියහොත් එය විශාල පාඩුවක් බවත් ඔවුන් කීහිපදෙනෙක්ම මා සමඟ මේ පිළිබඳව කතා කළ බවත් ප්‍රකාශ කරන ලදි. සභාව තක්සේරු කරන මුදලට වඩා වැඩි මුදලක් ගෙවීමට ඔවුන් එකඟ බවත් සභාව එසේ තීරණය කරනවා නම් එයට කැමති බව ප්‍රකාශ කරන ලදි. ඔවුන්ට සාධාරණයක් ඉෂ්ඨවිය යුතු බවත් ප්‍රකාශ කරන ලදි. ඇතැම් අයගේ එකම ආදායම් මාර්ගය එම ව්‍යාපාරය බවත් එම නිසා ඔවුන්ට යම් සාධාරණයක් ඉෂ්ඨ විය යුතු බව ප්‍රකාශ කරන ලදි. එම නිසා මම උප සභාපතිතුමාගේ තීරණය සමග සියයට සියයක් එකඟ බවත් ප්‍රකාශ කරන ලදි. අපේ නීතිමය තත්වයන් සමඟ බැලීමේදී යම් බාධාවන් තිබෙන නමුත් සභාවක් ලෙස සාකච්ඡා කොට යම් තීරණයකට එළඹීම සුදුසු පව පෙන්වා දෙන ලදි.

**ගරුඋපසභාපති එච්.එම්.ජගත් දේශප්‍රිය අබේවර්ධන මයා.**

පෞද්ගලික හිතවත්කම් මත සභාවට ලැබෙන ආදායම හානි කිරීමට මම අකමැති බවත් අපි යම් සාධාරණයක් කරන්නට යැයි කීවාට එය මුදල මත තීරණය විය යුතු බවත් පෙන්වා දෙන ලදි. උදාහරණයක් ලෙස රු.7500.00ට දැනට සිටින කෙනා කඩය ඉල්ලුවා යැයි යැයි සිතමු. වෙන කෙනෙක් එම කඩයටම රු. 8500.00කට ඉල්ලුවා යැයි සිතමු. එසේම යම් මුදලක් තීන්දු කර මේ මුදලට ඉහලින් ඉල්ලුවොත් පමණක් දැනට සිටින කෙනාට කඩය ලබා දෙන බව තීන්දු කර ගත යුතු බවත් , නැත්නම් කඩය ලබා දීමට ක්‍රමයක් නැති බව පැහැදිලි කර දිය යුතු බවත් කඩය කරන කෙනාටම වාසියටම දී සිටිය නොහැකි බවත් ඔහුටත් තරඟකාරීත්වයක් ලබා දිය යුතු බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ජේ.ආර්. ජගත් ප්‍රසන්න මයා.**

ඔබතුමා කියන කතාව නිවැරදි බවත් මේ ගණනට උඩින් කියා තව ගණනක් එකතුකරන්නට පුලුවන්කමක් නැති බවත් පෙන්වා දෙන ලදි. නමුත් මේ ආකාරයට සිදු කළ හැකි බවත්, උදාහරණයක් ලෙස රු.7300.00ට දැන් සිටින කෙනා ඉල්ලුම් කලා යැයි සිතමු. අනිත් පුද්ගලයා රු.12000.00ට ඉල්ලුම් කළා යැයි සිතමු. රු. 7300.00 සිට රු. 12000.00 දක්වා පරතරයෙහි ප්‍රතිශතයක් සකස් කරන්නට පුළුවන් බවත් ප්‍රකාශ කරන ලදි. එසේ ප්‍රතිශතය බැලූවිට එවිට අපට ගණනක් තීරණය කරන්නට අවශ්‍ය නොවන බව පෙන්වා දෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

තක්සේරු අගයක් දී ඇති බවත් තක්සේරු අගය සඳහන් කර අපි ටෙන්ඩර් කළ විට මින් එහාට මිල ගණන් යටතේ ඉල්ලන බවත් රෝහණ මන්ත්‍රීතුමා පැවසූ ආකාරයට ප්‍රතිශතයක් යටතේ ක්‍රියා කළ යුතු බවත් ඒ ප්‍රතිශතය කවුරුවත් දැනගත යුතු නොවන බවත් එය වසා තිබිය යුතු බවත් සභාවේ කවුරුවත් එය දැන ගැනීම සිදු නොවිය යුතු බවත් පෙන්වා දෙන ලදි. කමිටුවක් හදා එම කමිටුවේ අය පමණක් දැනගෙන එය සීල් කර තබා තිබිය යුතු බවත් පැහැදිලි කරන ලදි. එයත් එම අවස්ථාවේදීම කැඩිය යුතු බවත් සියල්ලටම එකම ප්‍රතිශතයක් විය යුතු බවත් පැහැදිලි කරන ලදි. ටෙන්ඩර් කැඩීමට පෙර මෙලෙස තීන්දුවක් අරගෙ න තිබෙන බව ඔවුන් දැනුවත් කරන බවත්, එම ප්‍රතිශතයට ආසාන්න මිලගණන් දැමූ අයට කඩය ලැබෙන බව පැහැදිලි කර දිය යුතු බවත් ප්‍රකාශ කරන ලදි. ටෙන්ඩර් මණ්ඩලයේ තීන්දුව අවසාන තීන්දුව බව පෙන්වා දිය යුතු බව ප්‍රකාශ කරන ලදි. උහන කඩ කාමර ගත් විට කඩ කරන අය ඉන්නේ පස් දෙනෙකු බවත් අතුරු බදු නොමැතිව ඉන්නා කඩකරුවන් පස්දෙනාගේ නම්,

| | |
|---|---|
| 01. ඩී.ජී.සී. බණ්ඩාර මයා | කඩකාමර අංක 08 |
| 02. පී.ඕ.එස්. කුමාරසිංහ මයා | කඩකාමර අංක 18 |
| 03. පී.එන්.එස්. මල්කාන්ති මිය | කඩකාමර අංක 19 |
| 04. ජී.සී. දමයන්ති මිය | කඩකාමර අංක 20 |
| 05. ඩබ්.එම්.ටී. වනසිංහ මයා | කඩකාමර අංක 22 |

බවයි. මේ පස් දෙනාට සහනයක් දිය යුතු බව පැහැදිලි කරන ලදි. මිල ගණන් ඉදිරිපත් කළ විට ප්‍රතිශතය අනුව කටයුතු කරන බව ඔවුන් දැනුවත් කළ යුතු බව පුකාශ කරන ලදි. දැනට මේ කියන පස් දෙනා සභාවට ගෙන්වා කරුණු පැහැදිලි කර දිය යුතු බව පෙන්වා දෙන ලදි.

**ගරු සභාපතිතුමා.**

මේ සාකච්ඡා කරපු කරුණු මූලා ප්‍රතිපත්ති කමිටුවේදී සාකච්ඡා කර තීරණයක් ගත යුතු බව ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මයා.**

අපි දැන් කඩවල ඉන්න අයට සාධාරණයක් කළ යුතු බව සත්‍ය බවත් ,නමුත් අපට මේ පිළිබඳ මෙහෙම තීන්දුවක් ගත නොහැකි වේවි බවත් පෙන්වා දෙන ලදි. රටේ පවතින නීතිමය තත්වය අනුව අප ටෙන්ඩර් කරන විට නීති උපදෙස් ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි. දැන් කඩ කරන අයට ප්‍රමුඛතාවය දිය යුතු බව නීතිඥතුමාට පවසා ඒ පිළිබඳ නීති උපදෙස් ලබා ගත යුතු බව ප්‍රකාශ කරන ලදි. මේ ප්‍රදේශයේ දැනට කඩයක් නැති නමුත් කඩයක් බලාපොරොත්තු වන පුද්ගලයෙක් අධිකරණයට ගියොත් එහෙම මොන ප්‍රතිපාදන යටතේද ප්‍රාදේශීය සභාව මේ තීන්දුව ගත්තේ යැයි අසා නඩුවක් පැවරුව හොත් අපට ඒ සඳහා පිළිතුරු හදා ගත යුතු බවත් එම නිසා නීති උපදෙස් අරගෙන මේ කටයුත්ත සිදුකිරීම සුදුසු බව මාගේ අදහස බවත් ප්‍රකාශ කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එච්.පී ප්‍රියන්ත සිසිර කුමාර මයා.**

දෙලංකාවල මන්ත්‍රීතුමා කියපුදේට මමත් එකඟ බවත් කඩ කාමර 23ක් ඇති නිසා ඔය කියන කඩ කාමර 23 සඳහා කවුරුවත් ඉදිරිපත් වුනේ නැති වුනොත් යැයි විමසන ලදි. කඩ කාමර ඉදිරිපිට විදුලි බුබුලක් (ලයිට් එකක්) දැමීම සිදු කිරීමට සියලු කඩ හිමියන් දැනුවත් කළ යුතු බවද පෙන්වා දෙන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

වැරන්කැටගොඩ කඩ කාමර ටෙන්ඩර් කිරීමේ දී ඔය කියන ප්‍රශ්නය පැන නැගුන බවත්, මම දේශපාලඥයෙක් නිසා හිතවත්කමට මේක බෙදා ගැනීමට හැකිවේ යැයි පුද්ගලයින් සිතා ටෙන්ඩර් ඉදිරිපත් නොකළ බවත් මම එසේ සිදු නොකොට ටෙන්ඩර් කළ බවත් ප්‍රකාශ කරන ලදි. නමුත් සමහරක් ටෙන්ඩර් ඉදිරිපත් කළ බවත් සමහරු ටෙන්ඩර් ඉදිරිපත් නොකළ බවත්, ටෙන්ඩර් ඉදිරිපත් කළ අය කඩ කාමර ලබා ගත් බවත් ප්‍රකාශ කරන ලදි. මේකෙත් එවැනි දේ සිදුවිය හැකි බවත් පළමු වන ටෙන්ඩරය දමා පාස් වූයේ නැත්නම් දෙවනියට ඉන්න කෙනාට නොදී නැවත ටෙන්ඩර් කළ යුතු බව ප්‍රකාශ කරන ලදි. එවැනි තීන්දුවක් ගත යුතු බවත් ටෙන්ඩර් දෙක තුනක් දමා පළමු එක නොගෙන සිටිනා බවත් එවැනි අවස්ථාවක නැවත ටෙන්ඩර් කළ යුතු බව ප්‍රකාශ කරන ලදි.

**ගරු සභාපතිතුමා.**

මූලා ප්‍රතිපත්ති කමිටුව සමඟ සාකච්ඡා කර තීන්දුවකට පැමිණීම සුදුසු බවත්,සභාවේ නීතිඥතුමා මඟින් නීති උපදෙස් ලබා ගැනීම සිදු කිරීම එකඟ බව ප්‍රකාශ කරන ලදි

**ගරු ප්‍රා.ස.මන්ත්‍රිනී කේ.වී.ජී.නයනා කුමුදුනී මිය.**

නීති ප්‍රකාරව අපි හිරවෙන තැනකුත් තිබෙන බවත් නමුත් මුල් කාලයේ අමාරුවෙන් ව්‍යාපාරය කර පසුව ව්‍යාපාරය යම් ස්ථාවරයකට ගොඩනගාගත් සියලුදෙනාට ප්‍රමුඛතාවය දිය යුතු බවත් තවකෙනෙක් කඩ කාමර ගැනීමට බලාපොරොත්තුවෙන් සිටිනම් ඔවුන්ටත් අවස්ථාව ලබා දිය යුතු බවත් උදාහරණයක් ලෙස යම් කෙනෙක් රු. 8000.00කට කඩය ඉල්ලන බවත් තවත් කෙනෙක් රු.15000.00කට කඩය ඉල්ලා නොලැබුණු විට ඔහුට මේ පිළිබඳව රිට් ආඥාවක් අධිකරණයෙන් ඉල්ලා සිටිය හැකි බව ප්‍රකාශ කරන ලදි. ප්‍රාදේශීය සභාව තමන්ගේ බලය අත්තනෝමතික ආකාරයට පාවිච්චිකර කටයුතු කළා යැයි පැවසිය හැකි බවත් එවැනි අවස්ථාවක සභාවක් ලෙස සභාව හිර වන බවත් ඒ නිසා තව ටිකක් කල්පනා කර අපට ගැලවීමට හැකි ආකාරයට මේ කාරණාව සම්බන්ධව සියල්ල හදා ගත යුතු බවත් ප්‍රකාශ කරන ලදි.දැනට කඩ කරන අයට සාධාරණයක් විය යුතු බවත් අපි එයට ක්ෂණිකව තීරණයක් ගතහොත් යම් යම් පාර්ශව වලට අගතියක් විය හැකි බව පෙන්වා දෙන ලදි.එය තව දුරටත් සාකච්ඡාකර තීරණයක් ගතයුතු බව පැහැදිලි කරන ලදි.

**ගරු සභාපතිතුමා.**

සභාවේ නීතිඥතුමාට අදම ලිපියක් යොමුකර මෙම කරුණ සම්බන්ධව නීති උපදෙස් ලබා ගන්නා ලෙස ලේකම්තුමිය දැනුවත් කරන ලදි.

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා.**

ටෙන්ඩර් කරන එකට හා දැනට සිටින කඩ හිමියන්ට ටෙන්ඩර් කිරීමේදී ප්‍රමුඛතාවයක් දෙන වැඩපිලවෙලක් සකස් කිරීමට යෝජනාවක් ගෙන ඇවිත් සභාව පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ඒකමතිකව එය සම්මත කර ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදි. න්‍යාය පත්‍රයේ යෝජනා අවස්ථාවේදී හදිසි යෝජනාවක් ලෙස මා විසින් එය ඉදිරිපත් කරන බව ප්‍රකාශ කරන ලදි.

**ගරු සභාපතිතුමා.**

515 අලාහ නඩුවේ නීතිඥ ගාස්තු ලෙස රු.15000.00 ක් ඉල්ලා උහන ප්‍රාදේශිය සභා නීතිඥතුමා ලිපියක් එවා ඇති බවත් එය සභාගත කරන බවත් ප්‍රකාශ කරන ලදි.

| | | |
|---|---|---|
| ආර්.ජී.කුලරත්න. (එල් එල්.බී)<br>නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස්,<br>දිවුරුම් කොමසාරිස්,<br>බී/ එල් -15, 3 වන මාවත,<br>අම්පාර. | ප්‍රාදේශීය සභාව<br>16 NOV 2022<br>උහන. | R.G.KULARATNE (LL.B)<br>Attorney-At-Law, N.P,<br>Commissioner For Oaths,<br>B/L-15, 3rd Avenue,<br>Ampara. |

kularatne123@gmail.com.0777140766/0632224283

දිනය:-2022-11-16

ලේකම් තුමා,
ප්‍රාදේශීය සභාව,
උහන.

මහත්මයාණනි,

515 අලාභ නඩුවේ නීතිඥ ගාස්තු

ඔබ ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති තමන් හා ගරු උප සභාපති තුමන් 01 හා 02 වන විත්තිකරුවන් කරමින් අම්පාර දිසා අධිකරණයේ පවරා තිබූ අංක 515/අලාභ නඩුවේ එකී විත්තිකරුවන්ට පෙනී සිටීම හා එහි කටයුතු කිරීම සම්බන්ධව පහත ගාස්තු ඉල්ලා සිටිමි.ජා හැ අ 19733400143

| | |
|---|---|
| 2022/10/03 දින පෙරකලාසි හා සිවිල් නඩු විධාන සංග්‍රහයේ 76 වගන්තිය යටතේ මූලික විරෝධතා ඉදිරිපත් කර පෙනී සිටීම | රු 10,000/= |
| 2022/10/14 දින නඩුව ඉල්ලා අස්කරගන්නා දින පෙනී සිටීම | රු 5,000/= |
| එකතුව | රු 15,000/= |

ඉදිරි දිනය-නැත

ස්තූතියි.

R.G. KULARATNE (LL.B)
Attorney - At - Law, N.P.
Commissioner for Oaths,
B.L. 15, 3rd Avenue, Ampara.
Tel:0777-140766/063-2224283
kularatne123@gmail.com
Bar Ass. Reg. No. K 791
Sc Reg. No A 14206

**ගරු සභාපතිතුමා.**

නඩු අංක 855 යටතේ නඩුවේ සිතාසිය උහන ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බවත් එය සභාගත කරන බව ප්‍රකාශ කරන ලදි.

04 AUG 2021
ලේඛනාගාරය
අම්පාර.

**අම්පාර දිසා අධිකරණයේ දී ය.**

**පැමිණිල්ල.**

දෙල්ගහගොඩ ගෙදර ගාමිණී ජයරත්න,
අංක 55, පාලම් කඳවුර,
උහන,
අම්පාර.

පැමිණිලිකරු

නඩු අංකය : 855/L

ස්වභාවය : ඉඩම්

පටිපාටිය : සාමාන්‍ය

වටිනාකම : රු.1,000,000/=

මුද්දර ගාස්තු අයකරන ලදි.
රු. 300 ශත 50
කුවිතාන්සි අංකය 5125 33 00 70
දිනය 2021/8/2

එදිරිව

ප්‍රාදේශීය සභාව,
උහන.

විත්තිකරු

වර්ෂ 2021 ක් වූ ජූලි මස 30 වන දිනදී ය.

යථෝක්ත නම සඳහන් පැමිණිලිකරු ස්වකිය නීතිඥ කේ. වී. චන්දිමා ප්‍රියදර්ශනි මහත්මිය මගින් පෙනී සිටිමින් ඉදිරිපත් කරනු ලබන පැමිණිල්ලෙන් මෙසේ ප්‍රකාශ කර සිටී.

01. ඉහත නම් සඳහන් විත්තිකාර ප්‍රාදේශීය සභාව පිහිටා ඇත්තේ ද, නඩු නිමිත්තට අදාළ විෂය වස්තුව පිහිටා ඇත්තේ ද මෙම අධිකරණයේ අධිකරණ බල සීමාව තුළ දී වන බැවින් මෙම නඩුව අසා තීන්දුවක් ලබා දීමට මෙම ගරු අධිකරණයට අධිකරණ බලය ඇති බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

02. ඉහත නම සඳහන් විත්තිකාර ප්‍රාදේශීය සභාව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව පිහිටුවන ලද ප්‍රාදේශීය සභාවක් වන බවත්, එය දැනට සක්‍රියව ක්‍රියාත්මක වන බවත්, එකී ප්‍රාදේශීය සභාව නඩු පැවරීමටත් පවරනු ලැබීමටත් හැකි නෛතික පුද්ගල ආයතනයක් වන බව පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

03. පැමිණිලිකරු මෙහි පහත පළමු උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ 1999.01.10 වන දින නිකුත් කරන ලද අංක අම්/ප්‍ර/උහන/4305 දරණ ප්‍රදාන පත්‍රය මත නීත්‍යානුකූලව හිමිකම ලැබ අඛණ්ඩව නිරවුල්ව බුක්ති විඳින ලද දේපළක් වන බවත් එකී ප්‍රදාන පත්‍රය අම්පාර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පවත්වා ගෙන යනු ලබන අංක යු 36/225 දරණ පත්ඉරුවෙහි ලියාපදංචි කර ඇති බව ප්‍රකාශ කර සිටී.
අදාළ අංක අම්/ප්‍ර/උහන/4305 දරණ ප්‍රදාන පත්‍රයේ ඡායා පිටපතක් පැ 01 ලෙසත් අංක යු 36/225 දරණ පත්ඉරුවෙහි ඡායා පිටපතක් පැ 02 ලෙසත් ලකුණු කර මෙම පැමිණිල්ලේ අත්‍යවශ්‍ය අංගයන් සේ ඉදිරිපත් කර සිටී.

04. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ වර්ෂ 2021.03.29 වන දින දරණ අංක UPS/DEV/01/Complain යටතේ විත්තිකාර ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් පැමිණිලිකරුගේ පුත්‍රයා වන ඉසංක තුසිත කුමාර යන අය අමතා "නිවාස සහ නගර සංවර්ධන ආඥා පනතේ 12 (2) වගන්තිය යටතේ නිකුත් කරනු ලබන නියෝගය" යන මාතෘකාව සහිත ලිපියක් නිකුත් කරමින් ඉසංක තුසිත කුමාර යන අය ප්‍රාදේශීය සභාව විසින් "අනුමත කරනු ලැබූ සැලැස්මත් නොමැතිව ඉදි කර ඇති/වෙනස් කර ඇති ගොඩනැගිල්ල/තාප්පය කඩා දැමීමට හේතු විමසමින් නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ 12 (1) ඒ දරණ ලිපියට වැඩිමනත් ලෙස නිවාස සහ නගර සංවර්ධන ආඥා පනතේ 5(6) (1) වගන්තිය /උල්ලංඝනය කරමින් ඉදි කර ඇති /වෙනස් කර ඇති ගොඩනැගිල්ල /තාප්පය/ඉනිවැට මෙම ලිපිය ලැබී දින 03ක් ඇතුළත කඩා ඉවත් කරන ලෙස එකී පනතේ 12(2) දරණ වගන්තිය යටතේ මෙයින් නියෝග කරන බවත්, මෙතෙක් කර ඇති ඉදි කිරීම් කඩා බිම දමන බවත් එයට කිසිදු වගකීමක් නොදක්වන බැවින් වහාම ඉදි කිරීම් නවත්වන ලෙසට නියෝග කරමි" යනුවෙන් දන්වා ලිපියක් එවන ලද බව ප්‍රකාශ කර සිටිමි.

එකී වර්ෂ 2021.03.29 වන දින දරණ අංක UPS/DEV/01/Complain දරණ ලිපිය පැ 03 ලෙස ලකුණු කර පැමිණිල්ලේ අත්‍යවශ්‍ය අංගයක් සේ පැමිණිල්ල සමග ඉදිරිපත් කර සිටී.

05. නමුත් එම ලිපිය ඉඩමේ නීත්‍යානුකූල හිමිකරු වන පැමිණිලිකරු නොව ඔහුගේ පුත්‍රයා අමතා එවන ලද ලිපියක් බවත්, ලිපිය ලැබීමට ප්‍රථම 2021.03.29 වන දින පැමිණිලිකරුට අයත් පහත උපලේඛනගත දේපළේ දකුණු මායිමෙහි ඉඩමෙන් කොටසක් අල්ලා අඩි 12 ක පමණ මාර්ගයක් තැනීමට එළිපෙහෙළි කළ බව ප්‍රකාශ කර සිටි. එකී බිම් කොටස පැමිණිල්ලේ පහත අනුඋපලේඛනයෙහි දක්වා ඇත.

එකී එළිපෙහෙළි කරන ලද මාර්ගය දක්වන්නා වූ ඡායාරූප පිළිවෙලින් පැ 04 අ, පැ 04 ආ, පැ 04 ඇ ලෙස ලකුණු කර පැමිණිල්ලේ අත්‍යවශ්‍ය අංගයක් සේ පැමිණිල්ල සමග ඉදිරිපත් කර සිටී.

06. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ මෙම මාර්ගය ඉදි කිරීම සඳහා විත්තිකාර ප්‍රාදේශීය සභාව විසින් කටයුතු කිරීම හේතුවෙන් එකී ඉඩම පෞද්ගලික මානකවරයෙකු ලවා මැන ගැනීම සඳහා උභන ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් ඉල්ලීම් කර තිබූ බවත්, ඒ අනුව එකී ඉඩම පෞද්ගලික මිනින්දෝරුවරයෙකු ලවා මැනීම සඳහා උභන ප්‍රාදේශීය ලේකම්තුමා විසින් පැමිණිලිකරුට අවසර ලබා දී තිබූ බවත්ය.

උභන ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් අම්/ප්‍ර/උභන/4305දරණ දීමනාපත්‍ර ඉඩම මැනුම් කිරීම සඳහා අවසර ලබා දෙන ලද අංකDSU/LAN/COLNY/JPA/239 සහ 2021.04.20 වන දින දරණ ලිපිය පැ 05 ලකුණු කර පැමිණිල්ලේ අත්‍යවශ්‍ය අංගයක් සේ පැමිණිල්ල සමග ඉදිරිපත් කර සිටී.

07. ඒ අනුව පැමිණිලිකරු විසින් පෞද්ගලික මිනින්දෝරුවරයෙක් වන බලයලත් මානක එස්. තේසරාජා මහතා ලවා ඉඩම මැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමේ දී අදාළ මිනින්දෝරුවරයාගේ මානක බලපත්‍රය පිළිබඳ ගැටළුවක් උද්ගත වීම නිසා එකී කටයුතු සිදු කර ගැනීමට නොහැකි වූ බවත් එය හුදෙක්ම මානකවරයාගේ මානක බලපත්‍රය මත ඇති වූ ගැටළුවක් බවත් එය පැමිණිලිකරුගේ පාලනයෙන් තොර එකක් වන බවත් ප්‍රකාශ කර සිටී.

08. එසේ තිබිය දී වර්ෂ 2021.04.24 වන දින විත්තිකාර ප්‍රාදේශීය සභාව විසින් ජේ.සී.බී. යන්ත්‍රයක ආධාරයෙන් පැමිණිලිකරුගේ ඉඩම මතින් පැමිණිල්ලේ පහත අනුඋපලේඛනයෙහි දක්වා ඇති බිම් කොටසෙහි මාර්ගය සකස් කිරීමට කටයුතු කළ බවත් ප්‍රකාශ කර සිටී.

09. පැමිණිලිකරු වැඩිදුරටත් ප්‍රකශ කර සිටින්නේ ඔහුගේ ඉඩමට යාබදව මෙම මාර්ගය සකස් කිරීම සඳහා ප්‍රමාණවත් භූමි ප්‍රමාණයක් තිබෙන බවත් එකී භූමි ප්‍රමාණයේ ඇති කුඩා ගල් තලාවක් හේතුවෙන් එකී භූමි ප්‍රමාණය භාවිත නොකර පැමිණිලිකරුගේ ඉඩම මතින් විත්තිකරු අත්තනෝමතිකව මෙම මාර්ගය ඉදිකිරීමට කටයුතු කිරීම තුළ පැමිණිලිකරු බලවත් ලෙස අගතියකට පත්ව ඇති බවයි.

10. තවද පැමිණිලිකරු ප්‍රකාහ කරසිටින්නේ මෙම මාර්ගය සකස් කිරීම මගින් ප්‍රවේශය ලබා ගත හැකි වන්නේ පවුල් ඒකක දෙකකට පමණක් වන බවත් ඔවුන්ට ද මෙලෙස ඉදි කිරීමට උත්සාහ කරනු ලබන මාර්ගය හැර දීර්ඝ කාලයක් භාවිත කරනු ලබන කාපට් අතුරා සකස් කරන ලද වෙනත් මාර්ගයක් දැනටමත් පවතින බවයි.
ඒ බව තහවුරු කිරීම සඳහා දැනට භාවිත කරනු ලබන මාර්ගය පෙන්වා දෙන්නා වූ ඡායාරූප පැ 06 අ, පැ 06 ආ ලෙස ද අන්තරජාලය මගින් ලබා ගන්නා ලද මෙම ප්‍රදේශය පැහැදිළිව දක්වන්නා වූ ඡායාරූප පැ 06 ඇසහ පැ 06 ඈ ලෙස ලකුණු කර පැමිණිල්ලේ අත්‍යවශ්‍ය අංගයක් සේ පැමිණිල්ල සමග ඉදිරිපත් කර සිටී.

11. එසේ තිබිය දී විත්තිකාර ප්‍රාදේශිය සභාව පැමිණිලිකරුගේ ඉඩමෙහි මායිම් අවිනිශ්චිත කරමින් පහත පළමු උපලේඛයෙහි දක්වා ඇති ඉඩමෙහි කොටසක් වන පහත අනුඋපලේඛනයෙහි දක්වා ඇති ඉඩම මතින් මාර්ගයක් සකස් කිරිමට කටයුතු කිරීම සාධාරණ සහ යුක්ති සහගත නොවන බවත් ප්‍රකාශ කර සිටී.

12. එසේ හෙයින් පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ පහත පළමු උපලේඛනයේ දක්වා ඇති ඉඩම මැනීම සඳහා පැමිණිලිකරුට අත්‍යවශ්‍ය ව ඇති බවත් ඒ අනුව ගරු අධිකරණයෙන් නිකුත් කරනු ලබන අධිකාරි පත්‍රයක් මත බලයලත් මානක කේ. ජී. අමරදේව මහතා ලවා පහත පළමු උපලේඛනගත දේපළ මැන ගැනීමට අවශ්‍ය බවත් ඒ සඳහා අවශ්‍ය අධිකාරපත්‍රය පැමිණිල්ල සමග ඉදිරිපත් කර සිටින බවත් මානකවරයාට ඉඩම මැනීම සඳහා කඩිනමින් නියෝගයක් ලබා ගැනිමට අවශ්‍යව ඇති බවත් ප්‍රකාශ කර සිටී.

13. තවද විත්තකාර ප්‍රාදේශීය සභාව විසින් පැමිණිලිකරුගේ පහත පළමු උපලේඛනයේ කොටසක් වන අනුඋපලේඛනයෙහි දක්වා ඇති දේපළ මතින් මාර්ගය සකස් කිරීමට කටයුතු කිරීම හේතුවෙන් පැමිණිලිකරුගේ ඉඩමෙහි මායිම් අවිනිශ්චිත වී ඇති බවත් ඒ අනුව පැමිණිල්ලේ පහත පළමු උපලේඛනයේ දක්වා ඇති දේපළෙහි නීත්‍යානුකූල හිමිකරු පැමිණිලිකරු වන බවට ප්‍රකාශ කරනු ලබන තීන්දුවක් සහ පැමිණිලිකරුගේ පැමිණිල්ලේ සඳහන් කර ඇති පහත පළමු උපලේඛනගත දේළළෙහි මායිම් නිශ්චය කර ගැනීම සඳහා අවශ්‍යව ඇති බවත් ඒ අනුව පැමිණිලිකරුගේ ඉඩමෙහි මායිම අවිනිශ්චිත කරමින් මාර්ගයක් සකස් කිරීමට කටයුතු කරන විත්තිකාර ප්‍රාදේශීය සභාවට එරෙහිව පැමිණිල්ලේ පහත පළමු උපලේඛනයේ දක්වා ඇති දේපළෙහි

නීත්‍යානුකූල හිමිකරු පැමිණිලිකරු වන බවට මෙන්ම පැමිණිලිකරුගේ පහත පළමු උපලේඛනගත දේපළෙහි මායිම් නිශ්වය කර ගැනීමට නඩු නිමිති උපවය වී ඇති බව ප්‍රකාශ කර සිටී.

14. තවද පැමිණිල්ලේ අනු උපලේඛනයෙහි විස්තර කරනු ලබන දේපළ ඇතුළුව පහත පළමු උපලේඛනයේ දැක්වෙන දේපළෙහි සන්තකය නැවත ලබා ගැනීමට පැමිණිලිකරුට හිමිකමක් ඇති බවට ප්‍රකාශ කරනු ලබන තීන්දුවක් ලබා ගැනීමට විත්තිකරුට එරෙහිව පැමිණිලිකරුට නඩු නිමිත්තක් උපවය වි ඇති බව ප්‍රකාශ කර සිටී.

15. පැමිණිලිකරුගේ පහත පළමු උපලේඛනයේ දක්වා ඇති දේපළෙහි මායිම් නිශ්වය කිරීමෙන් පසු එකී දේපළෙහි මායිම් අවිනිශ්චිත කරමින් එකී දේපළට ඇතුල් වී කටයුතු කරන්නා වූ විත්තිකාර ප්‍රාදේශීය සභාව සහ එකී ප්‍රාදේශීය සභාවේ සේවකයින් නියෝජිතයන් ආදී සියළු දෙනා නෙරපා හැර එම අනු උපලේඛනයෙහි විස්තර කරනු ලබන දේපළෙහි සාමකාමී භුක්තියෙහි පැමිණිලිකරු පිහිටුවන්නා වූ නියෝගයක් ලබා ගැනිමට විත්තිකරුට එරෙහිව පැමිණිලිකරුට නඩු නිමිත්තක් උපවය වි ඇති බව ප්‍රකාශ කර සිටී.

16. තවද පැමිණිලිකරුගේ පහත පළමු උපලේඛනයේ දක්වා ඇති දේපළින් මාර්ගය සකස් කිරිමට අනු අපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති දේපළ යොදා ගැනිම නිසා සිදු ව ඇති හානිය රුපියල් ලක්ෂ 10 ක් වන බවත් එකී රුපියල් ලක්ෂ දහයක (රු.1,000,000/-) හානිය විත්තිකාර ප්‍රාදේශීය සභාවෙන් අය කරවා ගැනිම සඳහා විත්තිකරුට එරෙහිව පැමිණිලිකරුට නඩු නිමිත්තක් උපවය වි ඇති බව ප්‍රකාශ කර සිටී.

17. පැමිණිලිකරු විසින් මෙම නඩුව පැවරීමට ප්‍රථම විත්තිකාර ප්‍රාදේශීය සභාවට ලියාපදිංචි තැපැල් මගින් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 214 (1) වගන්තිය ප්‍රකාරව දැන්වීම් යවා ඇති බවත්, තවදුරටත් තොරතුරු දැනගැනීමේ පනත යටතේ මෙම මාර්ගය සම්බන්ධයෙන් තොරතුරු ඉල්ලිමක් කළ බවත් එකී ඉල්ලීම සඳහා ද මෙතෙක් පිළිතුරු ලැබී නොමැති බවත් ප්‍රකාශ කර සිටී.
එකී 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 214 (1) වගන්තිය ප්‍රකාරව යවන ලද දැන්වීම පැ 07 ලෙසත් එහි ලියාපදිංචි තැපැල් භාණ්ඩ කුවිතාන්සිය පැ 07 අ ලෙසත් ලකුණු කර පැමිණිල්ලේ අත්‍යවශ්‍ය අංගයක් සේ පැමිණිල්ල සමග ඉදිරිපත් කර සිටී.

18. තවද පැමිණිලිකරු විසින් ගරු අධිකරණයෙන් ලබා ගන්නා අධිකාරි පත්‍රයක් මත මෙම පළමු උපලේඛනගත ඉඩම මැනිමෙන් පසු පැමිණිල්ල සංශෝධනය කිරීමට අවශ්‍ය විය හැකි බැවින් එකී පැමිණිල්ල සංශෝධනය කිරීමේ අයිතිය රඳවා තබා ගන්නා බව ප්‍රකාශ කර සිටි.

19. පැමිණිලිකරු මුද්දර ගාස්තු සඳහා මෙම නඩුව රුපියල් ලක්ෂ දහයක (රු.1,000,000/=) මුදලකට තක්සේරු කර සිටී.

එසේ හෙයින් පැමිණිලිකරු ගරු අධිකරණයෙන් ගෞරවයෙන් අයැද සිටින්නේ

අ) මුල් අවස්ථාවේදී ම පහත පළමු උපලේඛනගත දේපළ මැන මායිම් පෙන්වා දීම සඳහා පිඹුරක් සහ වාර්තාවක් ගරු අධිකරණයට ඉදිරිපත් කරන ලෙසට බලයලත් මිනින්දෝරුවරයාට අධිකාර පත්‍රය නිකුත් කිරීමට නියෝගයක් කරන ලෙසත්,

ආ) පැමිණිල්ලේ පහත පළමු උපලේඛනයේ දක්වා ඇති දේපළෙහි නීත්‍යානුකූල හිමිකරු පැමිණිලිකරු වන බවට ප්‍රකාශ කරනු ලබන තීන්දුවක් ද,

ඇ) පැමිණිලිකරුගේ පහත පළමු උපලේඛනයේ දක්වා ඇති දේපළෙහි මායිම් නිශ්චය කරමින් තීන්දු ප්‍රකාශයක් ලබා දෙන ලෙසත්,

ඈ) පැමිණිල්ලේ අනු උපලේඛනයෙහි විස්තර කරනු ලබන දේපළ ඇතුළුව පහත පළමු උපලේඛනයේ දැක්වෙන දේපළෙහි සන්තකය ලබා ගැනීමට පැමිණිලිකරුට හිමිකමක් ඇති බවට ප්‍රකාශ කරනු ලබන තීන්දුවක් ද,

ඉ) පැමිණිලිකරුගේ පහත පළමු උපලේඛනයේ දක්වා ඇති දේපළෙහි මායිම් නිශ්චය කිරීමෙන් පසු එකී දේපළෙහි මායිම් අවිනිශ්චිත කරමින් එකී දේපළට ඇතුල් වී කටයුතු කරන්නා වූ විත්තිකාර ප්‍රාදේශීය සභාව සහ එකී ප්‍රාදේශීය සභාවේ සේවකයින් නියෝජියන් ආදී සියළු දෙනා නෙරපා හැර එම අනු උපලේඛනයෙහි විස්තර කරනු ලබන දේපළෙහි සාමකාමී භුක්තියෙහි පැමිණිලිකරු පිහිටුවන්නා වූ නියෝගයක් ලබා දෙන ලෙසත්,

ඊ) පළමු උපලේඛනයේ දක්වා ඇති දේපළින් මාර්ගය සකස් කිරිමට අනු අපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති දේපළ යොදා ගැනිම නිසා පැමිණිලිකරු හට සිදු ව ඇති හානිය වන රුපියල් ලක්ෂ 10 ක් මුදලක් විත්තිකාර ප්‍රාදේශීය සභාවෙන් අය කර දෙන්නා වූ තීන්දු ප්‍රකාශයක් ලබා දෙන ලෙසත්

උ) නඩු ගාස්තු සහ

ඌ) ගරු අධිකරණයට සුදුසු යැයි හැඟෙන වෙනත් සහ වැඩිමනත් සහන ලබා දෙන ලෙසත් වේ.

පැමිණිල්ලේ නීතිඥ

නීතිඥ කේ. වී. චන්දිමා ප්‍රියදර්ශනී

BASL Reg. P 1690
SC Reg.No. A 16915

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී රංජිත් වනිගසිංහ ඒකනායක මයා**

මෙම නඩු කටයුත්තට පෙනී සිටීම සඳහා සභාවේ ඒකමතික බලය ලබා දෙන බව ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපතිතුමා**

නීතිඥතුමන්ගෙන් උපදෙස් ලබා ගෙන මෙම නඩු වලට පෙනී සිටිය යුතු බැවින් අදම සභාවේ නීතිඥතුමාට මේ ලිපිය යොමු කරන ලෙස ලේකම්තුමියට උපදෙස් දෙන ලදී.

## 04.සන්දේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම

**ගරු සභාපතිතුමා**

වෙළඳ හා කර්මාන්තහිමියන්ගේ සුභ සාධක සංගමය මඟින් උහන සේනානායක මාවත(උහන කනිටු විදුහල ඉදිරිපිටන් ඇති මාර්ගය) වන් වේ කිරීම සම්බන්ධ ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

**වෙළඳ හා කර්මාන්ත හිමියන්ගේ සුභසාධක සංගමය - උහන.**
**UHANA TRADE & INDUSTRIAL OWNERS WELFARE SOCIETY**
Email – uhanatiows@gmail.com

සභාපති :- එච්.කේ. රංජිත් ප්‍රේමලාල්,
විශාකා බේකර්ස්,
නුවර පාර - උහන.
077-7379730

ලේකම් :- ඊ.එන්. චමින්ද කුමාර,
රන්ලංකා සුදේශ් ට්‍රේඩර්ස්,
නුවර පාර - උහන.
077 -7113153

භාණ්ඩාගාරික :- නිමල් සේනානායක,
සියනෑ ස්ටෝර්ස්,
නුවර පාර - උහන.
077 -7734045

ප්‍රාදේශීය සභාව
02 NOV 2022
උහන.

2022.11.02

(2022.11.17 දින පැවැත්වීමට නියමිත උහන ප්‍රාදේශීය සභා මාසික රැස්වීමට ඉදිරිපත් කිරීම පිණිස)

ගරු සභාපති තුමා / ලේකම් මහත්මිය,
ප්‍රාදේශීය සභාව,
උහන.

<u>උහන සේනානායක මාවත (උහන කනිටු විදුහල ඉදිරිපිටින් ඇති මාර්ගය) වන්වේ (Oneway) කිරීම.</u>

උහන සේනානායක මාවත (උහන වීරගොඩ මාවත) උහන කනිටු විදුහල අසල දී වංගුවක් ලෙස පිහිටා ඇත. වීරගොඩ දෙස සිට උහන නගරය දක්වා එම මාර්ගයේ පැමිණෙන රථවාහන උහන කනිටු විදුහල අසල වංගුවේ දී අනතුරුදායක ලෙස ධාවනය කරයි. එයට හේතුව එම වංගුව පළලින් අඩු නිසාය. මෙම වංගුව අසල පාසල ආරම්භ කරන උදෑසන කාලයෙත්, පාසල අවසන් කරන දිවා හා සවස් කාලයෙත් පාසල් ළමුන් නිතරම ගැවසෙයි. එමෙන්ම උහන නගරය දෙස සිට වීරගොඩ දෙසට ධාවනය වන රථවාහන ද පැමිණේ. එවැනි අවස්ථාවල මෙසේ අනතුරුදායක ලෙස ධාවනය කරනු ලබන රථවාහන නිසා විශාල විනාශයක් සිදුවිය හැක. එමනිසා මෙම මාර්ගය උහන නගරයේ සිට උහන කනිටු විදුහල අසලින් වීරගොඩ දිශාවට පමණක් වාහන ධාවනයට නීති සකසන ලෙසත්, වීරගොඩ පැත්තේ සිට උහන කනිටු විදුහල අසලින් උහන නගරය දක්වා පැමිණෙන වාහන එම දිශාවට ගමන් කිරීම තහනම් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටින්නෙමු, අප දන්නා පරිදි මෙම යෝජනාව ක්‍රියාත්මක කළ හැක්කේ උහන ප්‍රාදේශීය සභාව මගින් පමණි. පවතින අනතුරුදායක තත්වය පිළිබඳව ඔබ සැමගේ විශේෂ අවධානය යොමු කර භයානක විනාශයක් සිදුවීමට පෙර අදාළ ක්‍රියාමාර්ග ගන්නා ලෙස තවදුරටත් කාරුණිකව ඉල්ලා සිටින්නෙමු.

මෙයට - විශ්වාස,

.................................
සභාපති
(එච්.කේ. රංජිත් ප්‍රේමලාල්)

.................................
ලේකම්
(ඊ.එන්. චමින්ද කුමාර)

පිටපත් :-

01. ගරු ආණ්ඩුකාර තුමිය - නැගෙනහිර පළාත - දැ. පි. සහ අවශ්‍ය කටයුතු සඳහා
02. නියෝජ්‍ය පොලිස්පති තුමා - අම්පාර - දැ. පි. සහ අවශ්‍ය කටයුතු සඳහා
03. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තුමා - අම්පාර - දැ. පි. සහ අවශ්‍ය කටයුතු සඳහා
04. සහකාර පොලිස් අධිකාරී තුමා - උහන. - දැ. පි. සහ අවශ්‍ය කටයුතු සඳහා
05. ස්ථානාධිපති තුමා - පොලිස් ස්ථානය - උහන. - දැ. පි. සහ අවශ්‍ය කටයුතු සඳහා
06. ප්‍රධාන ඉංජිනේරු තුමා - මාර්ග සංවර්ධන අධිකාරිය - අම්පාර - දැ. පි. සහ අවශ්‍ය කටයුතු සඳහා
07. උහන ප්‍රාදේශීය සභාවේ ගරු උපසභාපති තුමා ඇතුළු සියලුම ගරු මන්ත්‍රීවරුන් වෙත - දැ. පි. සහ අවශ්‍ය කටයුතු සඳහා

**ගරු ප්‍රා.ස. මන්ත්‍ර රංජිත් වනිගසිංහ ඒකනායක මයා**

වෙළඳ සංගමයෙන් මේ දීපු යෝජනාව පිළිබඳ විවේචනය කරන්න යන්නේ නැති බවත් නමුත් වෙළඳ සංගම් ලෙස මේ ආකාරයේ යෝජනා ද කළ යුත්තේ යන්න ප්‍රශ්නයක් තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. තවද "2022.11.17 වන දින පැවැත්වීමට නියමිත උහන ප්‍රාදේශීය සභා මාසික රැස්වීමට ඉදිරිපත් කිරීම පිණිස" ලෙස සඳහන් කර එවීමට හැකියාවක් නැති බවත් එය ඉදිරිපත් කරනවාද නැද්ද යන්න තීරණය කළ යුත්තේ ඔබතුමා නිසා එසේ එවීම ප්‍රශ්නයක් බවත් ප්‍රකාශ කරන ලදී. එසේ නොකර සභාවේ මන්ත්‍රීවරු වන මට හෝ දෙලංකාවල මන්ත්‍රීතුමාට මෙය ලබා දීමට තිබුණ බවත් ප්‍රකාශ කරන ලදී. මෙය මහා මාර්ග දෙපාර්තමේන්තුව තීන්දුවක් ගත යුතු කාරණයක් බවත් පෙන්වා දෙන ලදී. හදිසි නීතිය නැති එකත් එක කාරණයක් බවත් එසේ තිබුණා නම් මාර්ග බාධක දමා මේ පාරවල් වසා මෙවැනි තීරණ ගත හැකි බවත් පෙන්වා දෙන ලදී. මහා මාර්ග දෙපාර්තමේන්තුවට හෝ පොලිස් දෙපාර්තමේන්තුවටවත් එවැනි තීන්දු තීරණ ගත නොහැකි බව ප්‍රකාශ කරන ලදී. මෙහි මානුෂීය පැත්තකුත් ඇති බවත් මමත් පාසල් ගිය පාසල බවත් අඩුම තරමේ විදුහල්පතිවරයාට මෙම ඉල්ලීම කරන්නට තිබුණ බවත් ප්‍රකාශ කරන ලදී. ඊට අමතරව මෙතන දෙවියනේ කියා අනතුරක් මේ වන තුරු සිදුවී නොමැති බවත් පාර පළල් කිරීම සඳහා තීන්දු තීරණ අරගෙන මැනුම් කටයුතුත් සිදු වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී. ඒ ආකාරයට සිදු වූ විට මාර්ග තද බදය අඩුවන බවද ප්‍රකාශ කරන ලදී. ඊළඟට ප්‍රශ්නය තිබෙන්නේ බැරිවෙලාවත් මෙතන වැහුව්වොත් සාම්ප්‍රධායිකව අම්පාර ඩී.එස්. සේනානායක විද්‍යාලය ඉදිරිපිට උදේට පාර වසන බවත් ළමයි ගේට්ටුවෙන් ඇතුලට ගිය පසු නැවත පාර අරින බවත් නැවත පාසල ඇරෙන වෙලාවට නැවත පාර වසන බවත් ප්‍රකාශ කරන ලදී. ඒ ආකාරයේ දෙයකට එකඟතාවක් වන්නට පුළුවන් බවත් එහෙම නැතුව මේ පාර වන් වේ කිරීම ගැන විරුද්ධ බවත් ප්‍රකාශ කරන ලදී. මෙහි සමහරුන්ගේ ව්‍යාපාර අරමුණුත් තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. මේකට සභාවෙන් තීන්දුවක් ගැනීමට නොහැකි බවත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් මෙයට තීන්දුවක් ගත යුතු බවත් පෙන්වා දෙන ලදී. මේ තිබෙන නීතිය අනුව මාර්ග සංවර්ධන අධිකාරියටත් තීන්දුවක් ගත නොහැකි බව ප්‍රකාශ කරන ලදී. මාගේ මේ සඳහා එකඟතාවයක් නැති බවත් සභාවට ගත හැකි තීන්දුවක් ගන්නා ලෙසත් ප්‍රකාහ කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී කේ.බී. විමලරත්න මයා**

එච්.කේ. රංජිත් ප්‍රේමලාල් මහතා මෙම සභාවේ සිටිය කෙනෙක් ලෙස මේ ආකාරයට ලිපියක් ඉදිරිපත් කිරීම ගැන පුදුම වන බවත් මේක යෝජනාවක් ද, පෙත්සමක්ද, පැමිණිල්ලක්ද යන්න පැහැදිළි නොමැති බවත් පෙන්වා දෙන ලදී. මම මෙය දකින්නේ සන්දේශයක් ලෙසයි. මෙය ඔබතුමාට ආවානම් ඔබතුමා යෝජනාවක් ලෙස මෙය දමන බවත් මේ පනත ප්‍රකාරව මෙහි අපට අයිතියක් නැති බවත් අපට අයිතියක් නැති පාරක කිසිම දෙයක් කරන්නට බැරි බව පනතේ තිබෙන බවත් මේක මාර්ග සංවර්ධන අධිකාරියට අයිති පාරක් බවත් එමනිසා මේක අපට අයිති නැති බවත් පෙන්වා දෙන ලදී. නමුත් අපට මේ ආකාරයට ඉල්ලීමක් කළ හැකි බවත් මාර්ග සම්බන්ධව සිටින ඇමතිවරයාට මෙය දැනුම් දී එම ඇමතිවරයාගේ කැමැත්ත අකමැත්ත මත ඔබ කටයුත්තට යා හැකි බවත් ප්‍රකාශ කරන ලදී. මේක හරිම සරල දෙයක් බව ප්‍රකාශ කරන ලදී. මේක පොලිසියේ රථ වාහන අංශයට දැනුම් දීමක් සිදු කළ හැකි බව පෙන්වා දෙන ලදී. උදේ දරුවන් පාසලට පැමිණෙන වෙලාව හා සවස පාසල ඇරෙන වෙලාවට පොලිස් රථ වාහන අංශයට මෙය කළ හැකි බව පෙන්වා දෙන ලදී. ඒ ඇරෙන්න අපට මේ කටයුත්ත කිරීමට ප්‍රතිපාදන නොමැති බව ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී ඩී.ඒ. දෙලංකාවල මයා**

මේ මාර්ග දෙකෙන් එකක ජීවත් වන පුද්ගලයෙකු ලෙස මමත් මේ ගැන කතා කළ යුතු බවත් මේ ලිපිය ලැබුණාට පසු වෙළඳ ව්‍යාපාරිකයන් කිහිප දෙනෙකු සමඟ මමත් මේ ගැන සාකච්ඡා කළ බවත් වෙළඳ ප්‍රජාව විදිහට සමහරු මේකට අකමැති බව ප්‍රකාශ කරන ලදී. එසේම මේක ප්‍රායෝගිකවත් අපහසු කටයුත්තක් බවත් අපි වීරගොඩ පාරෙන් අම්පාරට එන අය ඩිස්පෙන්සරිය පාවිච්චි කරන අය ඉන්න

පුළුවන් බවත් නැවත උදේගිරිය පැත්තෙන් එන්නට වන බවත් පාසල් ගුරුවරු ආදී අය ළමයි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය ළඟ සිට පයින් යන්න වන බවත් මෙතන අනතුරක් විය හැකි ස්ථානයක් බව සත්‍ය බවත් ප්‍රකාශ කරන ලදී. මේ ලිපිය යොමු කළ වෙළඳ සංගමයේ සභාපතිවරයා ඔතනම ලොකු අනතුරක් සිදුවූ බවත් පෙන්වා දෙන ලදී. එයට එකම විසඳුම මේ පාර වන් වේ කිරීම නම් නොවන බව මගෙත් අදහස බව ප්‍රකාශ කරන ලදී. ස්ථිර තීන්දුවක් ගැනීමට අපට කළ නොහැකි බවත් අප මේ සඳහා මැදිහත් නොවී ඉමු යැයි ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී කේ.බී. විමලරත්න මයා**

සභාවක් ලෙස පොලිස් ස්ථානයට ලිපියක් යැවීමට කටයුතු කළ හැකි බවත් එසේම අද දිනයේ සභාව මඟින් ගත් තීන්දුව වෙළඳ සංගමය දැනුවත් කිරීම සුදු සු බවත් ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී සුසන්ත කුමාර කුසුම්සිරි මයා**

උඟනින් මෙහාට පාළම් කඳවුර පැත්තට යන ළමයින්ට පොලිසිය පැත්තට පයින් එන්න වන බවත් වීරගොඩ පැත්තට යන ළමයින්ට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය ළගට පයින් එන්නට වන බවත් ප්‍රකාශ කරන ලදී. එනවිට හා යන විට ඔය සිද්ධියට මුහුණ දෙන්නට සිදුවන බව ප්‍රකාශ කරන ලදී. එසේ පයින් යන විට මීට වඩා අනතුරු සිදුවිය හැකි බව පෙන්වා දෙන ලදී.

**ගරු සභාපතිතුමා**

සභාවේ විරෝධතාවයක් නැතිව අපි ඒකමතිකව තීන්දුවක් ගත් බවත් සභාවට මේ සඳහා මැදිහත් විය නොහැකි බව දන්වා යැවීම සිදු කරමු යැයි ප්‍රකාශ කරන ලදී. අපට පනත ප්‍රකාරව එය ක්‍රියාත්මක කිරීමට බලතල නැති බව දන්වා යැවීමට තීරණයක් ගත් බව දන්වා යවමු යැයි ප්‍රකාශ කරන ලදී.

**ගරු ප්‍රා.ස. මන්ත්‍රී කේ.බී. විමලරත්න මයා**

"වෙනත් යම් අධිකාරියකට නීතියෙන් පවරන ලද බලතල හා වගකීම් වලට යටත්ව ප්‍රාදේශීය සභාවේ සීමාවේ ඇතුලත ප්‍රධාන මංමාවත් නොවන සියලු මංමාවත් හා මාර්ග සම්බන්ධතා පිළිබඳ කාර්ය සඳහා ප්‍රාදේශීය සභාවේ මේ පනත නිවාස හා නගර සංවර්ධන ආඥා පනත හා ඒ සඳහා කලින් කළ පනවනු ලබන වෙනත් යම් ප්‍රඥප්ති යටතේ එම සභාව වෙත පැවරී ඇති සියලු බලතල සමඟ සාමාන්‍ය පරිපාලන අධිකාරිය විය යුතුය" යනුවෙන් පනතේ සඳහන් වන බවත් එහිදි අපට එයට මැදිහත් වෙන්නට බැරි බව ප්‍රකාශ කරන ලදී. එසේම මෙම පනතේ තව තැනක මෙසේ ප්‍රකාශ කරන බවත් "ප්‍රධාන මාවතක් නොවන යම් ප්‍රසිද්ධ වීදියක හෝ මං මාවතක් සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් මහා මාර්ග විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව යම් ප්‍රධාන මාවතක්ද පුළුල් කිරීම, විවෘත කිරීම, ලොකු කිරීම හෝ වෙනත් අන්දමකින් වැඩි දියුණු කිරීම හෝ හැරවීම, වෙනත් අතකට යොමු කිරීම වසා දැමීම අවසන් කිරීම ඒ කාර්යයන් සඳහා අවශ්‍ය වන යම් දේපළක් අයිතිකරුවන් හෝ එමනිසා අපට මේ කාර්ය අයිතියක්ම නැති බව" පෙන්වා දෙන ලදී. මේ පිළිබඳව කතා කරනවානම් විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ගත යුතු ක්‍රම අප විසින් හදාගත යුතු බව ප්‍රකාශ කරන ලදී.

**05. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න සභාවට ඉදිරිපත් කිරීම**

ගරු ප්‍රා.ස. මන්ත්‍රී කේ.බී. විමලරත්න මහතා විසින් අසනු ලබන ප්‍රශ්න සභා ගත කිරීම

කේ.බී විමලරත්න,
ප්‍රා ඃ සභා මන්ත්‍රී,
අංක 13 සමනබැද්ද,
උහන
2022/11/08

ප්‍රාදේශීය සභාව
08 NOV 2022
උහන.

ලේකම්තුමිය,
ප්‍රාදේශිය සභාව,
උහන.

## 2022 නොවැම්බර්මහ සභාවේදී අසන ලබන ප්‍රශ්න

පහත ප්‍රශ්න සභාපතිවරයාගෙන් අසනු ලබයි.

1. ශ්‍රී ඃලංඃනි පක්ෂයෙන් උහන ප්‍රාදේශිය සභාවෙන් හත්වන සභාවාරය සඳහා තෝරාපත්කරන ලද Y.V.A දිස්නා ජානකි මන්ත්‍රීවරියගේ,

   I. 2022 අප්‍රේල් මස දීමනාව ගෙවනු ලැබුවේද?

   II. 2022 අප්‍රේල් මස දීමනාව ගෙවනු නොලැබුවේද?

   III. එසේ නම් ඒ මන්ද?

   IV. ඇයගේ මන්ත්‍රීධූරය අහෝසි කරනු ලැබූ ගැසට් නිවේදනය සභාවට ඉදිරිපත් කරන්නේද?

මෙයට
විශ්වාසි

..............................
ප්‍රා ඃ සභා මන්ත්‍රී
කේ.බී විමලරත්න

ඩී.ඒ.අයි. ඉරෝෂා මැණිකේ
ලේකම්
ප්‍රාදේශීය සභාව
උහන.

# උහන ප්‍රාදේශීය සභාව
## UHANA PRADESHIYA SABHA
## உஹன பிரதேச சபை

මගේ අංකය:
My No. } UPS/Chairman/Com/2022
எனது இல

ඔබේ අංකය:
Your No } 2022.11.17
உம் இல


ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,

කේ.බී. විමලරත්න මයා.

ප්‍රාදේශීය සභාව,

උහන.

**2022 නොවැම්බර් මස මහා සභාවේදී අසන ලද ප්‍රශ්න සඳහා පිළිතුරු**

ඔබ විසින් 2022.11.08 දින ඉදිරිපත් කරන ලද ලිපියෙන් අසන ලද ප්‍රශ්න සඳහා පිළිතුරු පහත පරිදි ඉදිරිපත් කරමි.

1. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් උහන ප්‍රාදේශීය සභාවෙන් හත්වන සභා වාරය සඳහා තෝරාපත් කරන ලද වයි.වී.ඒ. දිස්නා ජානකී මන්ත්‍රීවරියගේ,

I. 2022 අප්‍රේල් මස දීමනාව ගෙවනු ලැබුවේද ? නැත

II. 2022 අප්‍රේල් මස දීමනාව ගෙවනු නොලැබුවේද ? ඔව්

III. එසේනම් ඒ මන්ද ?

මෙම මන්ත්‍රීතුමිය අප්‍රේල් මස සභාවට පැමිණියේ නැත. නොපැමිණීම පිළිබඳ එදින සභාවට දන්වා ඇත. එය සභාවෙන් අනුමත කරන ලදි. නමුත් දීමනාව ලබා ගැනීමට ඇය පැමිණියේ නැත. අප්‍රේල් 07 වන දින මහ සභාව පැවති අතර. 2022.04.08 දින ඇයගේ සභික ධූරය අතහැරීමේ ගැසට් නිවේදනය පල කර තිබුණි. දීමනාව ගෙවීම සම්බන්ධයෙන් උපදෙස් පැතීම සඳහා මේ වන විට පළාත් පාලන කොමසාරිස්තුමා වෙත ඉදිරිපත් කර ඇත. මේ වන විට පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් පළාත් පාලන කොමසාරිස් වෙත උපදෙස් පතා ලිපි යොමු කර ඇත. එම ලිපිය දැනුම්දීම් යටතේ ඉදිරිපත් කර ඇත.

IV. ඇයගේ මන්ත්‍රී දූරය අහෝසි කරනු ලැබූ ගැසට් නිවේදනය සභාවට ඉදිරිපත් කරන්නේද ? ඔව්

සභාපති,

ප්‍රාදේශීය සභාව,

උහන.

සභාපති
ඩී.ජී. උපුල් ප්‍රියන්ත
ප්‍රාදේශීය සභාව
උහන.


